# (ඈ) මුදල් හා බැංකු කටයුතු හැඩනැස්ම

## (අ) 1. මුදල් සැපයුම - ප්‍රධාන උපනතීන්

1970 වර්ෂය තුළදී, මුදල් සැපයුම රුපියල් දශ ලක්ෂ 83.5 කින් හෙවත් සියයට 4.5 කින් වැඩි විය. ඉකුත් වර්ෂයේදී, එය රුපියල් දශ ලක්ෂ 30.1 කින් හෙවත් සියයට 1.6 කින් පහළ වැටී තිබිණි. 1970 වර්ෂයේදී මුදල් සැපයුමෙහි මාසික සාමාන්‍ය, ඉකුත් වර්ෂයේදී වූ ප්‍රමාණයට වඩා සියයට 4.0 කින් ඉහළය.

වර්ෂාවසාන මට්ටම සැසැඳීමක් අනුව මුදල් සැපයුමෙහි වැඩිවීමක් දක්වීමෙන් වර්ෂය මුළුල්ලේ පැවති මූල්‍ය ප්‍රසාරණයෙහි සැබෑ උපනතීන් නියමාකාරයෙන් පැහැදිලි කරගත නොහැක. II (ඈ) 1 වැනි සංඛ්‍යා සටහනින් දක්වෙන පරිදි, ජනවාරි මාසයේදී රුපියල් දශ ලක්ෂ 11·0 ක පහළ වැටීමකින් අනතුරුව ජූලි මාසයේදී පමණක් ඇති වූ රුපියල් දශ ලක්ෂ 6.5 ක සුළු අඩුවීමක් හැර, ඔක්තෝබර් මාසය දක්වාම මුදල් සැපයුම ක්‍රමයෙන් ඉහළ ගියේය. 1969 දෙසැම්බර් අග සිට 1970 ඔක්තෝබර් අග දක්වා වූ කාලච්ඡේදය තුළදී, මුදල් සැපයුමෙහි වැඩිවීම රුපියල් දශ ලක්ෂ 184.4 ක් හෙවත් සියයට 9.8 ක් විය 1970 වර්ෂයේ මුල් මාස දහය තුළදී, මුදල් සැපයුමෙහි මාසික සාමාන්‍ය මට්ටම රුපියල් දශ ලක්ෂ 1973ක් වූ අතර, රුපියල් දශ ලක්ෂ 1968ක් වූ මුළු වර්ෂයේම මාසික සාමාන්‍යයට වඩා එය ඉහල විය.

### II (ඈ) 1 සංඛ්‍යා සටහන
### මුදල් සැපයුම

රුපියල් දශ ලක්ෂ වලිනි

| කාලච්ඡේදය අවසානයේදී | 1965 | 1966 | 1967 | 1968 | 1969 | 1970 | % වෙනස 1965 සහ 1966 අතර | % වෙනස 1966 සහ 1967 අතර | % වෙනස 1967 සහ 1968 අතර | % වෙනස 1968 සහ 1969 අතර | % වෙනස 1969 සහ 1970 අතර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි .. | 1,615 | 1,693 | 1,598 | 1,792 | 1,883 | 1,872 | + 4·8 | − 5·6 | +12·1 | + 5·1 | − 0·6 |
| පෙබරවාරි .. | 1,582 | 1,674 | 1,687 | 1,793 | 1,880 | 1,884 | + 5·8 | + 0·8 | + 6·3 | + 4·8 | + 0·2 |
| මාර්තු .. | 1,585 | 1,666 | 1,817 | 1,831 | 1,911 | 1,932 | + 5·1 | + 9·1 | + 0·8 | + 4·4 | + 1·1 |
| අප්‍රේල් .. | 1,601 | 1,675 | 1,781 | 1,857 | 1,917 | 1,942 | + 4·6 | + 6·3 | + 4·3 | + 3·2 | + 1·3 |
| මැයි .. | 1,645 | 1,698 | 1,723 | 1,869 | 1,900 | 1,974 | + 3·2 | + 1·5 | + 8·5 | + 1·7 | + 3·9 |
| ජූනි .. | 1,650 | 1,692 | 1,731 | 1,857 | 1,918 | 1,990 | + 2·5 | + 2·3 | + 7·3 | + 3·3 | + 3·7 |
| ජූලි .. | 1,693 | 1,757 | 1,718 | 1,831 | 1,872 | 1,983 | + 3·8 | − 2·2 | + 6·6 | + 2·2 | + 5·9 |
| අගෝස්තු .. | 1,674 | 1,702 | 1,678 | 1,839 | 1,880 | 2,017 | + 1·7 | − 1·4 | + 9·6 | + 2·2 | + 7·3 |
| සැප්තැම්බර් .. | 1,675 | 1,681 | 1,700 | 1,850 | 1,885 | 2,066 | + 0·4 | + 1·1 | + 8·8 | + 1·9 | + 9·6 |
| ඔක්තෝබර් . | 1,687 | 1,682 | 1,761 | 1,889 | 1,891 | 2,068 | − 0·3 | + 4·7 | + 7·3 | + 0·1 | + 9·4 |
| නොවැම්බර් .. | 1,677 | 1,655 | 1,787 | 1,896 | 1,902 | 1,927 | − 1·3 | + 8·0 | + 6·1 | + 0·3 | + 1·3 |
| දෙසැම්බර් .. | 1,716 | 1,659 | 1,808 | 1,913 | 1,883 | 1,967 | − 3·3 | + 9·0 | + 5·8 | − 1·6 | + 4·5 |
| මාසික සාමාන්‍යය .. | 1,650 | 1,686 | 1,732 | 1,851 | 1,893 | 1,968 | + 2·2 | + 2·7 | + 6·9 | + 2·3 | + 4·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වර්ෂයේ මුල් මාස දහය තුළදී, මුදල් සැපයුමෙහි වැඩිවීමට තුඩුදුන් ප්‍රධාන සාධකය වූයේ, රජයට දුන් බැංකු ණයවල ඇති වූ ප්‍රසාරණයයි. රජයට දුන් බැංකු ණය ප්‍රමාණයෙහි වැඩිවීම තුළින් ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑමට සාපේක්ෂව සුළු වුවද, පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය ප්‍රමාණයෙහි වැඩිවීමක් එම ප්‍රසාරණයට කොටස්කාරී විය.

වර්ෂයේ මුල් මාස දහය තුළදී, මූල්‍ය ප්‍රසාරණයෙහි පැවති මෙම වේගවත් අනුපාතික යෙහි නැවතීමක්, ඇත්තෙන්ම ආපසු හැරීමක් නොවැම්බර් මාසයේදී දක්නට ලැබුණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 1970 ඔක්තෝබර් 25 වැනි දින රුපියල් 100 යේ සහ රුපියල් 50 හේ මුදල් නෝට්ටු විමුල්‍යනය කිරීමයි. විමුල්‍යනය නිසා නොවැම්බර් මාසයේදී මුදල් සැපයුම රුපියල් දශ ලක්ෂ 140.9 කින් සීඝ්‍ර ලෙස පහළ වැටිණි. රජයේ මුදල් ශේෂයන් සැහෙන ප්‍රමාණයකින් වැඩි වූ අතර, රජයට දුන් බැංකු ණය ප්‍රමාණය අඩු විය.

මේ අනුව, නොවැම්බර් මාසයේදී මුදල් සැපයුමෙහි කැපී පෙනෙන සුළු සංකෝචනයක් දැකිය හැක. දෙසැම්බර් මාසයේදී ප්‍රධාන වශයෙන් රජයේ කටයුතු නිසා, මෙම උපනතිය ආපසු හැරුනේ, මුදල් සැපයුම රුපියල් දශ ලක්ෂ 39·9 කින් හෙවත් සියයට 2·1 කින් යළිත් වැඩි විය.

වර්ෂයේ මුල් මාස දහය තුළදී, මුදල් සැපයුමෙහි වූ මෙම සැලකිය යුතු වැඩිවීම සංසරණ ප්‍රවේගයෙහි වැඩිවීමක් හා සම්බන්ධිත බවද පෙනී යයි. මුදලේ සංසරණ ප්‍රවේගයෙහි වෙනස ගණනය කිරීමේ පාර්ශ්වීය දර්ශකයන් පමණක් වන, මහජනයා සතු ඉල්ලුම් තැන්පතු පිරිවැටුම් අනුපාතිකයෙහි මාසික සාමාන්‍ය, මෙම කාලච්ඡේදයේදී, 1969 වර්ෂයේ මාසික සාමාන්‍යයට වඩා සියයට 6·2 කින් ඉහල ගියේය. කෙසේ වුවද, 1970 වර්ෂයේ අවසාන දෙමාසය සඳහා වූ සාමාන්‍යය, මුල් මාස දහය සඳහා වූ සාමාන්‍යයට වඩා සියයට 21.2 කින් අඩු වූවකි. මුදල් සැපයුමෙහි අඩුවීමත් සමග මෙයද සැළකිල්ලට ගත් කල වර්ෂයේ අවසාන දෙමාසය තුළදී, රටේ ගනුදෙනු පරිමාවෙහි ඇති වූ පහළ වැටීමක් එමගින් පෙන්නුම් කෙරෙනවා විය හැක.

2. මුදල් සැපයුම කෙරෙහි බලපාන සාධක.

මුදල් සැපයුම කෙරෙහි බලපාන සාධකයන් පිළිබඳ විශ්ලේෂණයක් II (ඈ) 2 වැනි සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ.

1970 වර්ෂයේදී, මුදල් සැපයුම කෙරෙහි ප්‍රධානතම ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති වූයේ, රජයේ මූල්‍ය කටයුතු තුළිනි. එමගින් ඇති වූ ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශ ලක්ෂ 105·2 ක් විය. 1969 වර්ෂයේ දී එය රුපියල් දශ ලක්ෂ 235.5 කි. කෙසේ වුවද, 1970 වර්ෂයේ මුල් මාස දහය තුළදී, රජයේ මූල්‍ය කටයුතු තුළින් ඇති වූ ප්‍රසාරණය රුපියල් දශ ලක්ෂ 165.6 ක් විය. විමුල්‍යනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජයේ මූල්‍ය සම්පත් වැඩිවීම හේතුකොට ගෙන, ඊළඟ දෙමාසයේදී මෙම ප්‍රසාරණාත්මක බලපෑම් සැහෙන තරමකින් අඩු වුණි. 1970 වර්ෂයේදී රජයේ මුදල් ශේෂයන් රුපියල් දශ ලක්ෂ 124·2කින් වැඩි විය. 1969 වර්ෂයේදී, ඒවා රුපියල් දශ ලක්ෂ 71.9 කින් පහළ වැටී තිබිණි. කෙසේ වුවද, 1970 වර්ෂයේ මුල් මාස දහය තුළදී, රජයේ මුදල් ශේෂයන්හි රුපියල් දශ ලක්ෂ 25.1 ක මඳ වැඩිවීමක් දක්නට ලැබේ.

1970 වර්ෂයේදී, බැංකු ක්‍රමය වෙත වූ රජයේ ණය ගැති භාවයෙහි වැඩිවීම ඉකුත් වර්ෂයේදී වූ ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 232.3 කින් වැඩි වූ බව පෙනේ. මහ බැංකුවෙහි රාජ්‍ය පත්‍ර දැරීම් රුපියල් දශ ලක්ෂ 126·2 කින් ද, එහි අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 29·5 කින් ද වැඩිවූයෙන්, මහ බැංකුව වෙත වූ රජයේ ණයගැති භාවයෙහි මුළු වැඩිවීම රුපියල් දශ ලක්ෂ 155·7ක් විය. මහ බැංකුවෙන් ගත් ණය ප්‍රමාණය වැඩි කිරීමට රජයට සිදුවූයේ, ප්‍රධාන වශයෙන්ම සහතික මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීම සඳහා වෙළඳ බැංකු මගින් දෙන ලද බඩු තොග කුවිතාන්සි අත්තිකාරම්හි එකතු වී තිබුණු ප්‍රමාණය අඩුකරලීම සඳහාය.

1970 වර්ෂයේදී වෙළඳ බැංකු මගින් රජයට දෙන ලද ණය ප්‍රමාණයෙහි රුපියල් දශ ලක්ෂ 194·1 ක සීඝ්‍ර ප්‍රසාරණයක් දක්නට ඇත. 1969 වර්ෂයේදී එහි වැඩිවීම රුපියල් දශ ලක්ෂ 13·1 ක් පමණි. භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශ ලක්ෂ 236·4 කින් ද, රජයේ සහ රජය මගින් සහතික කරන ලද සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 98·5 කින්ද, රජයේ ගිණුම් මත මිළදී ගත් චෙක්පත් ආදී ස්වරූපයෙන් යුත් කෙටි කාලීන ණය රුපියල් දශ ලක්ෂ 0·7 කින්ද ඇතිවූ වැඩිවීමකින් සහ රජයේ ආනයන බිල්පත් රුපියල් දශ ලක්ෂ 141·8 කින් අඩුවීමකින් 1970 වර්ෂයේදී වූ වැඩිවීම සැකසුනේය.

රජයේ මුදල් ශේෂයන් රුපියල් දශ ලක්ෂ 124·2 කින් ද,මහ බැංකුවේ අනෙකුත් වගකීම සහ ගිණුම් (ශුද්ධ) රුපියල් දශ ලක්ෂ 120·4 කින්ද වැඩිවීම හේතුකොට ගෙන, බැංකු ක්‍රමයෙන් රජයට දුන් ණය ප්‍රමාණයෙහි වැඩිවීමක් තුළින් ඇති වූ රුපියල් දශ ලක්ෂ 349·8 ක මුළු ප්‍රාසාරණාත්මක බලපෑම, අඩ වශයෙන් සමහන් විය. මේ අනුව අවසාන ප්‍රතිඵලය වූයේ, රාජ්‍ය අංශය තුළ රුපියල් දශ ලක්ෂ 105·2 ක ශුද්ධ ප්‍රසාරණයක් ඇති වීමයි.

## II (ඈ) 2. සංඛ්‍යා සටහන

## මුදල් සැපයුමේ වෙනස්වීම් සහ එයට පදනම් වූ සාධක (වර්ෂාවසාන සංඛ්‍යා අනුවය.)

රුපියල් දශලක්ෂ වලිනි.

| මුදල් සැපයුමට බලපාන සාධක | 1964 අවසානයේ සිට 1965 අවසානයට | | 1965 අවසානයේ සිට 1966 අවසානයට | | 1966 අවසානයේ සිට 1967 අවසානයට | | 1967 අවසානයේ සිට 1968 අවසානයට | | 1968 අවසානයේ සිට 1969 අවසානයට | | 1969 අවසානයේ සිට 1970 අවසානයට | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක |
| 1. බැංකු සතු විදේශීය වත්කම් (ශුද්ධ) .. .. | 79.8† | — | — | 196.3 | — | 91.5 | — | 115.7 | — | 299.6 | — | 1.5 |
| 2. පෞද්ගලික අංශය‡ .. .. | 19.2 | 75.4 | 137.2 | 79.6 | 105.6 | 133.1 | 264.1 | 165.5 | 226.0 | 193.8 | 219.4 | 238.3 |
| (අ) සමුපකාර ආයතනවලට දෙන ලද වෙළඳ බැංකු ණය .. | — | 6.9 | 25.8 | — | 7.3 | — | 18.5 | — | 19.9 | — | 146.3 | — |
| (ආ) පෞද්ගලික අංශයේ අනිකුත් ගනුදෙනුකරුවන්ට දෙනලද වෙළඳ බැංකු ණය .. .. | 10.0 | — | 33.5 | — | 86.9 | — | 155.0 | — | 136.2 | — | — | 42.0 |
| (ඇ) සමුපකාර ආයතනවල කාලීන හා ඉතුරුම් තැන්පතු .. | — | 2.1 | — | 2.3 | — | 1.4 | — | 1.5 | — | 2.9 | — | 7.6 |
| (ඈ) පෞද්ගලික අංශයේ අනිකුත් ගනුදෙනුකරුවන්ගේ කාලීන හා ඉතුරුම් තැන්පතු .. .. | — | 46.2 | — | 65.3 | — | 49.5 | — | 99.9 | — | 144.4 | — | 188.7 |
| (ඉ) වෙළඳ බැංකුවල අනිකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) .. | — | 20.2 | — | 12.0 | — | 31.0 | — | 40.9 | — | 35.7 | 12.4 | — |
| (ඊ) රජයේ සමායතනවලට දෙන ලද වෙළඳ බැංකු ණය .. | 7.8 | — | 27.7 | — | 11.4 | — | 90.6 | — | 69.9 | — | 43.2 | — |
| (උ) රජයේ සමායතන සතු කාලීන හා ඉතුරුම් තැන්පතු .. | 1.4 | — | 50.2 | — | — | 51.2 | — | 23.2 | — | 10.8 | 17.5 | — |
| 3. රාජ්‍ය අංශය | 120.3 | 53.2 | 207.5 | 125.5 | 267.8 | — | 306.9 | 184.5 | 243.1 | 7.6 | 349.8 | 244.6 |
| (අ) වෙළඳ බැංකු වෙතැති භාණ්ඩාගාර බිල්පත්, රජයේ හා රජය ඇපවූ සුරැකුම් පත් සහ රජයේ ආනයන බිල්පත් .. | 92.3 | — | — | 62.6 | 75.3 | — | — | 114.9 | 4.9 | — | 193.4 | — |
| (ආ) රාජ්‍ය ගිණුම යටතේ මිලදී ගත් මුදල් ශීර්ෂ .. | — | — | — | — | — | — | — | — | 8.2 | — | 0.7 | — |
| (ඇ) මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ හා රජය ඇපවූ සුරැකුම් පත් .. .. | — | 38.7 | 155.9 | — | 109.9 | — | 269.4 | — | 112.0 | — | 126.2 | — |
| (ඈ) මහ බැංකුවේ අත්තිකාරම් .. .. | 28.0 | — | 26.4 | — | 12.7 | — | 37.5 | — | — | 7.6 | 29.5 | — |
| (ඉ) මහ බැංකුවේ අනිකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) .. | — | 4.5 | 25.2 | — | 13.9 | — | — | 0.2 | 46.1 | — | — | 120.4 |
| (ඊ) බැංකු ක්‍රමය වෙතැති රජයේ තැන්පතු හා භාණ්ඩාගාරය හා කච්චේරි වෙතැති මුදල් ශේෂ .. .. | — | 10.0 | — | 62.9 | 56.0 | — | — | 69.4 | 71.9 | — | — | 124.2 |
| 4. හුවමාරුවෙහි පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිලි .. .. | 3.2 | — | — | 0.1 | — | 0.1 | 0.2 | — | 1.7 | — | — | 1.1 |
| මුළු ප්‍රසාරණාත්මක/සංකෝචනාත්මක සාධක .. | 222.5 | 128.6 | 344.7 | 401.5 | 373.4 | 224.7 | 571.2 | 465.7 | 470.8 | 501.0 | 569.2 | 485.5 |
| මුදල් සැපයුමෙහි වෙනස .. | + 93.8 | | − 56.8 | | + 148.7 | | + 105.6 | | − 30.1 | | + 83.5 | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

† 1965 මැයි මාසයේදී, රජයේ ආයතන වලින් මහ බැංකුව මිලට ගන්නා ලද රුපියල් දශලක්ෂ 3·1 ක මුහුණත වටිනාකම ඇති විදේශීය වත්කම්ද ඇතුළත්ය; මෙම හුවමාරුව සඳහා ඉඩහළ විට ශුද්ධ බැංකු විදේශීය වත්කම්හි රුපියල් දශලක්ෂ 49·6 ක වැඩිවීමක් දිස්විය. රජයේ ආයතනවලට රුපියල් වලින් මෙය ගෙවීම හේතු කොට ගෙන මුදල් සැපයුම කෙරෙහි සෘජු ප්‍රසාරණාත්මක බලපෑමක් ඇතිවිය.

‡ වට්ටම් කළ අපනයන බිල්පත්වල වටිනාකම බැංකු විදේශීය වත්කම් යටතේ ඇතුළත් කෙරිණ.

1970 වර්ෂයේදී පෞද්ගලික අංශයට දුන් බැංකු ණය ප්‍රමාණයෙහි වැඩිවීම රුපියල් දශ ලක්ෂ 147·5 ක් විය. 1969 වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 226·0 ක වැඩිවීමක් හා සසඳන විට, එහි සැලකිය යුතු අඩුවීමක් පෙනේ. සමුපකාර ආයතනවලට දෙන ලද ණය ප්‍රමාණයෙහි රුපියල් දශ ලක්ෂ 146·3 ක විශාල වැඩිවීමක් දක්නට තිබිණි. මෙම වැඩිවීමෙහි සංයුතිය වූයේ, සහතික මිළ ක්‍රමය යටතේ රජයට වී විකිණීම සඳහා දුන් බඩු තොග කුවිතාන්සි අත්තිකාරම්හි රුපියල් දශ ලක්ෂ 144·3 ක වැඩිවීමක් ද, කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ දුන් ණය ප්‍රමාණයෙහි රුපියල් දශ ලක්ෂ 5·4 ක වැඩිවීමක් සහ අනෙකුත් ණය ප්‍රමාණයෙහි රුපියල් දශ ලක්ෂ 3·4 ක අඩුවීමකි. 1969 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 11·6 කින් වූ අඩුවීමකට සාපේක්ෂව 1970 වර්ෂයේදී, බඩු තොග කුවිතාන්සි ණය ප්‍රමාණයෙහි සැලකිය යුතු වැඩිවීමක් ඇතිවීමට ප්‍රධ න වශයෙන් හේතු වූයේ, සහතික මිළ ක්‍රමය යටතේ මිළදී ගත් වී ප්‍රමාණයෙහි වැඩිවීමයි. මිළට ගත් වී ප්‍රමාණය, 1969 වර්ෂයේදී බුසල් දශ ලක්ෂ 14·0 ක සිට 1970 වර්ෂයේදී බුසල් දශ ලක්ෂ 26·4 දක්වා වැඩි විය.

රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද වෙළඳ බැංකු ණය 1970 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 43·2 කින් ඉහළ ගියේය. ඉකුත් වර්ෂයේදී ඒවා රුපියල් දශ ලක්ෂ 69·9 කින් වැඩි වී තිබිණි. 1970 වර්ෂයේදී වූ වැඩිවීම, ලෝන සහ අයිරාවන්හි රුපියල් දශ ලක්ෂ 49·8 ක වැඩිවීමකින් සහ, බැංකු සතු ආනයන බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3·8 කින්ද, මිළදී ගත් මුදල් ශීර්ෂ රුපියල් දශ ලක්ෂ 2·9 කින්ද පහළ වැටීමකින් සමන්විත විය. වැඩිවූ ලෝන සහ අයිරාවන්ගෙන් විශාල ප්‍රමණයක්, එනම් රුපියල් දශ ලක්ෂ 38·0 ක්ම, මැදි හා දිගු කාලීන ණය විය.

මෑත කාලයේදී, ක්‍රමයෙන් වැඩිවෙමින් තිබුණු, පෞද්ගලික අංශයෙහි අනෙකුත් අයට දෙන ලද බැංකු ණය ප්‍රමාණය, විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 42·0 කින් පහළ වැටිණි. ඒවායේ නොපියවා තිබූ ශේෂයන්, වර්ෂයේ මුල් දෙමාසය තුළදී වැඩි වූ අතර, මාර්තු සහ අප්‍රේල් මාසවලදී සැලකියයුතු ප්‍රමාණයන්ගෙන් අඩු වුණි. වර්ෂයේ ඉතිරි මාසවලදී, ඒවායේ වැදගත් වෙනස්වීම් දැකිය නොහැක.

බැංකු ණය ශීර්ෂයන්ගෙන් විශාලතම අඩුවීමක් දක්නට තිබුනේ ආනයන බිල්පත් දැරීම සම්බන්ධයෙනි. ඒවා, 1969 දෙසැම්බර් අවසානයේදී රුපියල් දශ ලක්ෂ 55·0 සිට 1970 දෙසැම්බර් අවසානයේදී, රුපියල් දශ ලක්ෂ 27·8 දක්වා පහළ වැටිණි. එය, පෞද්ගලික අංශයට (රාජ්‍ය සංස්ථාවන් සහ සමුපකාරයන් හැර) දෙන ලද මුළු බැංකු ණය ප්‍රමාණයෙහි අඩුවීමෙන් සියයට 60 කටත් වඩා වැඩි ප්‍රමාණයකි. එම අංශයට දෙන ලද බැංකු ණය ප්‍රමාණය අඩුවීමට ප්‍රධාන කොටම හේතු වූයේ,1970 වර්ෂය තුළදී පනවන ලද, දැඩි ආනයන සීමාවන් යයි සිතිය හැක. අයිරාවන්ද, රුපියල් දශ ලක්ෂ 13·5 කින් පහළ වැටුණු අතර, ලෝන සුළු වශයෙන්, එනම් රුපියල් දශ ලක්ෂ 2·1 කින් ඉහළ ගියේය.

ණය ප්‍රමාණය තුළින් ඇති වූ රුපියල් දශ ලක්ෂ 42·0ක සංකෝචනයට අමතරව, වෙළඳ බැංකු වෙත වූ පෞද්ගලික අංශය සතු (රාජ්‍ය සංස්ථාවන් සහ සමුපකාරයන් හැර) කාලීන හා ඉතුරුම් තැන්පතු ද රුපියල් දශ ලක්ෂ 188·7 කින් ඉහළ ගොස් තිබිණි. 1969 වර්ෂයේදී ඒවා රුපියල් දශ ලක්ෂ 144·4 කින් වැඩි වී තිබිණි.

පෞද්ගලික අංශයට (රාජ්‍ය සංස්ථාවන් හා සමුපකාරයන් ඇතුළුව) දුන් ණය ප්‍රමාණයෙහි වැඩිවීම තුළින් මුදල් සැපයුම කෙරෙහි ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑම, මෙම අංශය මගින් වෙළඳ බැංකු වෙත රැස් කරන ලද කාලීන හා ඉතුරුම් තැන්පතු තුළින්, ප්‍රමාණයටත් වඩා සමහන් කෙරිණි. මෙම තැන්පතුවල රුපියල් දශ ලක්ෂ 178·8 ක වැඩිවීමක් දැකිය හැක 1969 වර්ෂයේදී ඒවා රුපියල් දශ ලක්ෂ 158·1කින් වැඩිවී තිබුණි. 1970 වර්ෂයේදී වූ මෙම වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේ විමුද්‍රාකරණයයි. ඒ යටතේ, මහජනයා සතුව තිබුණු ව්‍යවහාර මුදල් වලින් කිසියම් ප්‍රමාණයක් බැංකු වෙත තැන්පත් කිරීම අවශ්‍යයෙන්ම කළයුතු විය. 1970 සැප්තැම්බර් මාසයේ අවසානය දක්වා පෞද්ගලික අංශයේ කාලීන හා ඉතුරුම් තැන්පතුවල වූ වැඩිවීම රුපියල් දශ ලක්ෂ 30·8ක් පමණි. වෙළඳ බැංකුවල අනෙකුත් වගකීම් හා ගිණුම්හි (ශුද්ධ) රුපියල් දශ ලක්ෂ 12·4ක

පහළ වැටීමක් තුළින් ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑමත් මෙහිදී සැළකිල්ලට ගත්කළ, 1970 වර්ෂය තුළදී පෞද්ගලික අංශයේ කටයුතුවල ප්‍රතිඵලය වූයේ, මුදල් සැපයුම කෙරෙහි රුපියල් දශ ලක්ෂ 18·9 ක ශුද්ධ සංකෝචනාත්මක බලපෑමක් ඇති වීමය. කෙසේ වුවද, වර්ෂයේ මුල් මාස දහය තුළදී, පෞද්ගලික අංශයේ කටයුතු ප්‍රසාරණාත්මක විය. ඒ රුපියල් දශ ලක්ෂ 37·6 ක ප්‍රමාණයකිනි.

මෑත වර්ෂ වලදී මෙන් නොව, 1970 වර්ෂයේදී, විදේශ ගෙවුම් ශේෂ හිඟයෙහි සංකෝචනාත්මක බලපෑම අතිශයින් කුඩා එකකි. රුපියල් දශ ලක්ෂ 393·1 ක් වූ ගෙවුම් ශේෂයෙහි වර්තන ගිණුමේ හිඟය, 1969 වර්ෂයේදී වූ හිඟයට වඩා සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුය. 1969 දී එහි හිඟය රුපියල් දශ ලක්ෂ 796·9ක් විය. මෙම හිඟය සම්පූර්ණයෙන්ම පාහේ පියවන ලද්දේ රජය ලබාගත් විදේශාධාර වලින් සහ කෙටිකාලීන ණය ප්‍රමාණයෙහි ශුද්ධ වැඩිවීමක් මගිනි. මේ අනුව. එකී හිඟය තුළින් මුදල් සැපයුම කෙරෙහි ඇති වූ සංකෝචනාත්මක බලපෑම රුපියල් දශ ලක්ෂ 1·5 කට සීමාවිය.

1970 වර්ෂයේදී, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය රුපියල් දශ ලක්ෂ 28·8 කින් වැඩිවිය. ඉකුත් වර්ෂයේදී, එහි රුපියල් දශ ලක්ෂ 70·3 ක අඩුවීමක් දක්නට තිබිණි. වෙළඳ බැංකුවල විදේශීය වත්කම් ද., 1969 දී රුපියල් දශ ලක්ෂ 18·9 කින් අඩුවී තිබුණත් 1970 දී ඒවා රුපියල් දශ ලක්ෂ 12·1 කින් වැඩිවුණි. බැංකු ක්‍රමයේ විදේශීය වගකීම් රුපියල් දශ ලක්ෂ 42·4 කින් වැඩි විය. මෙය සම්පූර්ණයෙන්ම පාහේ මහ බැංකුව මගින් විදේශ බැංකු වලින් ගත් ණය ප්‍රමාණයෙහි වැඩිවීමක් නිසා සිදුවූවකි. රුපියල් දශ ලක්ෂ 155·6 ක්වූ මෙම ණය ගැනීම්හි වැඩිවීම, ජාත්‍යන්තර සංවිධානවලට වූ මහ බැංකුවේ වගකීම් රුපියල් දශ ලක්ෂ 106·1 කින් අඩුවීම නිසා සැලකිය යුතු ප්‍රමාණයකින් සමහන් විය. මෙහි දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හැරගත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 56·6 ක්වූ අතර ආපසු ගෙවූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 160·7 ක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් කළ හැරගැනීම් සඳහා වූ සේවා ගාස්තු රුපියල් දශ ලක්ෂ 19·3 ක් විය. අනෙකුත් වගකීම්, ප්‍රධාන වශයෙන්ම මහ බැංකුව මගින් පවත්වා ගෙන යනු ලබන ගෙවීම් සම්මුති ගිණුම් යටතේ විදේශීය රටවල්වලට ගෙවිය යුතු ශේෂයන්, රුපියල් දශ ලක්ෂ 21·2 කින් අඩුවිය.

මේ අනුව, මුදල් සැපයුමෙහි රුපියල් දශ ලක්ෂ 83·5 ක ශුද්ධ වැඩිවීමක් සඳහා මූලික වශයෙන්ම තුඩු දුන්නේ රාජ්‍ය අංශයේ කටයුතු බව පෙනේ, මුදල් සැපයුමෙහි මෙම වැඩිවීම, වර්ෂාවසාන මට්ටම අතර වෙනස්වීම් තුළින් මැනීමේදී ඉකුත් වර්ෂයේ මට්ටමට වඩා, සියයට 4·5 කින් වැඩිවී ඇති බව පැහැදිලිය. ඒ දළ ජාතික නිෂ්පාදිතයෙහි සියයට 3·9 ක වර්ධනයක් තිබියදීය එහෙත්. මුලින් පෙන්වා දී ඇති පරිදි, මුදල් සැපයුමෙහි වෙනස, වර්ෂාවසාන සංඛ්‍යාවන් අනුව මැනීමේදී, වර්ෂය මුළුල්ලේදී පැවති මූල්‍ය ප්‍රසාරණයෙහි වේගය ප්‍රමාණවත් ලෙස පිළිබිඹු නොකෙරෙයි. වර්ෂයෙහි මුල් මාස දහය තුළදී, කැපී පෙනෙන සුළු ප්‍රසාරණ වේගයක් පැවතිණි.

3. බැංකු නොවන පෞද්ගලික අංශයෙහි ද්‍රවශීලතාවය

1968-70 අතර කාලච්ඡේදය සඳහා බැංකු නොවන පෞද්ගලික අංශයේ මූලික හා ද්විතියික ද්‍රවශීල වත්කම් ව්‍යාප්තිය 11 (ඇ) 3 වැනි සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ.

මූලික ද්‍රවශීල වත්කම්, 1969 වර්ෂය අවසානයේදී පැවැති මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 83·5 කින් හෙවත්, සියයට 4·5 කින් වැඩි වූ අතර මුළු ද්‍රවශීල වත්කම් එකතුව රුපියල් දශ ලක්ෂ 451·8 කින් හෙවත් සියයට 10·0 කින් ඉහළ ගියේය. මුළු ද්‍රවශීල වත්කම් එකතුවෙහි, මෙබඳු සැලකිය යුතු වැඩිවීමකට තුඩු දුන්නේ, ද්විතියික ද්‍රවශීල වත්කම්හි රුපියල් දශ ලක්ෂ 368·3 ක හෙවත් සියයට 14·1 ක වැඩිවීමකි. එය ප්‍රධාන කොටම, සැකසුනේ වෙළඳ බැංකු සහ තැපැල් කාර්යාලයීය ඉතිරි කිරීමේ බැංකුව වෙත වූ ඉතුරුම් තැන්පතු වලිනි; රජයේ පිළින පත් සහ බදු සංචිත සහතික පත්‍ර සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවිය. 1970 වර්ෂය අවසානයේදී, ද්විතියික ද්‍රවශීල වත්කම් මුළු ද්‍රවශීල වත්කම් එකතුවෙන් සියයට 60·3 ක් විය. ඉකුත් වර්ෂයේදී එම අනුපාතය සියයට 58·2 ක් වී. ද්විතියික ද්‍රවශීල

## II (ඈ) 3 සංඛ්‍යා සටහන

## බැංකු නොවන පෞද්ගලික අංශයෙහි ද්‍රවශීල වත්කම්

| සැකැස්ම | ප්‍රමාණය (රුපියල් දශලක්ෂ) | | | දළ ජාතික නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් (අ) | | |
|---|---|---|---|---|---|---|
| | 1968 | 1969 | 1970 | 1968 | 1969 | 1970 |
| 1· මූලික ද්‍රවශීල වත්කම | | | | | | |
| (අ) නෝට්ටු හා කාසි .. | 1,066·2 | 1,083·9 | 935·1 | 10·9 | 10·1 | 8·1 |
| (ආ) ඉල්ලුම් තැන්පතු .. | 847·0 | 799·2 | 1,031·5 | 8·6 | 7·4 | 8·8 |
| එකතුව .. | 1,913·2 | 1,883·1 | 1,966·6 | 19·5 | 17·5 | 16·9 |
| වෙනසෙහි සියයට ගණන .. | + 5·8 | − 1·6 | +4·5 | | | |
| 2· ද්විතීයික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) වෙළෙඳ බැංකු වෙතැති ඉතුරුම් තැන්පතු .. | 319·6 | 375·1 | 534·3 | 3·3 | 3·5 | 4·6 |
| (ආ) තැපැල් කන්තෝරු ඉතිරි කිරීමෙ බැංකුව වෙතැති ඉතුරුම් තැන්පතු .. | 473·3 | 490·5 | 574·2** | 4·8 | 4·6 | 4·9 |
| (ඇ) ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතැති ඉතුරුම් තැන්පතු .. | 100·3 | 102·3 | 108·9* | 1·0 | 0·9 | 0·9 |
| (ඈ) වෙළඳ බැංකු වෙතැති කාලීන තැන්පතු .. | 491·7 | 594·3 | 613·8 | 5·0 | 5·5 | 5·3 |
| (ඉ) මෙරට නේවාසිකයන් සතු විදේශීය ශේෂ .. | 0·9 | — | — | ... | — | — |
| (ඊ) ඉතුරුම් සහතික පත් .. | 91·3 | 86·3 | 73·8* | 0·9 | 0·8 | 0·6 |
| (උ) භාණ්ඩාගාර බිල්පත් .. | 11·5 | 15·4 | 12·7 | 0·1 | 0·1 | 0·1 |
| (ඌ) බදු සංචිත සහතික පත් .. | 23·9 | 15·8 | 43·5 | 0·2 | 0·1 | 0·4 |
| (එ) රජයේ පිළිනපත් .. | 874·3 | 937·4 | 1,024·2 | 8·9 | 8·7 | 8·8 |
| එකතුව .. | 2,386·8 | 2,617·1 | 2,985·4 | 24·3 | 24·3 | 25·7 |
| වෙනසෙහි සියයට ගණන .. | +12·4 | + 9·6 | + 14·1 | | | |
| 3· පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් .. | 4,300·0 | 4,500·2 | 4,952·0 | 43·8 | 41·9 | 42·7 |
| වෙනසෙහි සියයට ගණන .. | + 9·4 | + 4·7 | + 10·0 | | | |
| තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව, ලංකා ඉතිරිකිරීමේ බැංකුව, සේවක අර්ථ සාධක අරමුදල ආදී රජයේ මූල්‍ය ආයතන වෙතවූ භාණ්ඩාගාර බිල් පත් සහ රජයේ පිළිනපත් ඉහතින් දක්වා ඇති සංඛ්‍යාවන්ට ඇතුළත් කොට නොමැත. .. | 1,859·1 | 2,026·5 | 2,168·9 | 18·9 | 18·8 | 18·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) පවත්නා සාධක වියදම් මිල අනුව.

* තාවකාලිකය.

** නොවැම්බර් මාසය සඳහා වූ සංඛ්‍යාවයි.

## II (ඇ) 4 සංඛ්‍යා සටහන

### මුදල් සැපයුමෙහි සැකසුම

රුපියල් දශලක්ෂ වලින්

| කාලච්ඡේදය අවසානයේදී | මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | | මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | | මුළු මුදල් සැපයුම |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | |
| 1957 | 434·9 | 41·8 | 605·2 | 58·2 | 1,040·1 |
| 1958 | 529·8 | 49·2 | 546·9 | 50·8 | 1,076·8 |
| 1959 | 565·0 | 48·0 | 612·7 | 52·0 | 1,177·7 |
| 1960 | 595·3 | 49·2 | 613·6 | 50·8 | 1,208·9 |
| 1961 | 692·2 | 53·8 | 596·4 | 46·2 | 1,288·6 |
| 1962 | 712·6 | 53·1 | 630·0 | 46·9 | 1,342·7 |
| 1963 | 828·4 | 55·0 | 677·7 | 45·0 | 1,506·0 |
| 1964 | 853·0 | 52·6 | 768·8 | 47·4 | 1,621·8 |
| 1965 | 901·4 | 52·5 | 814·3 | 47·5 | 1,715·7 |
| 1966 | 882·5 | 53·2 | 776·4 | 46·8 | 1,658·9 |
| 1967 | 979·9 | 54·2 | 827·7 | 45·8 | 1,807·6 |
| 1968 | 1,066·2 | 55·7 | 847·0 | 44·3 | 1,913·2 |
| 1969 | 1,083·9 | 57·6 | 799·2 | 42·4 | 1,883·1 |
| 1970 | 935·1 | 47·5 | 1,031·5 | 52·5 | 1,966·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## II (ඇ) 5 සංඛ්‍යා සටහන

### රුපියල් 100, 50, 10 සහ 5 ගේ වටිනාකම අනුව ව්‍යවහාර මුදල් සංයුතිය

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | රු: 100 | රු: 50 | රු: 10 | රු: 5 | ව්‍යවහාර මුදල් නිකුතුව* |
|---|---|---|---|---|---|
| 1956 .. | 114·9 | 97·7 | 148·0 | 30·0 | 443·4 |
| 1957 .. | 116·5 | 116·7 | 155·8 | 29·9 | 475·1 |
| 1958 .. | 157·5 | 143·6 | 184·0 | 33·7 | 578·3 |
| 1959 .. | 174·5 | 152·1 | 193·5 | 36·2 | 621·3 |
| 1960 .. | 148·4 | 148·4 | 237·6 | 40·1 | 644·6 |
| 1961 .. | 211·9 | 180·3 | 254·6 | 42·1 | 763·8 |
| 1962 .. | 238·2 | 186·8 | 241·9 | 42·8 | 789·4 |
| 1963 .. | 275·3 | 236·7 | 257·6 | 46·5 | 900·9 |
| 1964 .. | 168·4 | 258·3 | 359·5 | 55·5 | 932·1 |
| 1965 .. | 239·9 | 297·8 | 319·7 | 50·5 | 1,002·8 |
| 1966 .. | 272·0 | 292·9 | 288·2 | 48·6 | 993·7 |
| 1967 .. | 316·2 | 313·1 | 296·3 | 51·3 | 1,072·8 |
| 1968 .. | 393·7 | 330·6 | 299·5 | 55·3 | 1,181·9 |
| 1969 .. | 435·7 | 322·9 | 293·7 | 54·1 | 1,212·7 |
| 1970 .. | 252·0 | 261·0 | 384·4 | 71·4 | 1,090·4 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* රුපියල් 2 සහ රුපියල් 1 වටිනාකම සඳහන් නෝට්ටු හා කාසි සියල්ලම අඩංගු වෙයි.

වත්කම්හි මෙවර ඇතිවූ වැඩිවීම, සම්පූර්ණයෙන්ම පාහේ, විමුල්‍යනය නිසා සිදුවූවක් විය හැක. 1970 සැප්තැම්බර් මාසය අවසානයේදී මුළු ද්‍රවශීල වත්කම් එකතුවෙහි අඩංගුවූ ද්විතීයික ද්‍රවශීල වත්කම ප්‍රමාණය සියයට 57·1 ක් විය.

මූලික ද්‍රවශීල වත්කම් වෙනස්වීම පිළිබඳ ඉතාම වැදගත් ලක්ෂණය වූයේ, ඉල්ලුම් තැන්පතු සමානුපාතයෙහි ඇතිවූ සැලකිය යුතු වැඩිවීමයි. පසුගිය දශකය පමණ කාලය තුළදීම දක්නට තිබුනේ, ඉල්ලුම් තැන්පතුවලට සාපේක්ෂව ව්‍යවහාර මුදල් සඳහා කැපී පෙනෙන සුළු මහජන වරණයකි. 1970 වර්ෂය අවසානයේදී, මූලික ද්‍රවශීල වත්කම (මුදල් සැපයුම) එකතුවෙහි ඉල්ලුම් තැන්පතු කොටස සියයට 52·5 ක ප්‍රමාණයකින් යුක්ත විය. 1969 වර්ෂය අවසානයේදී, එය සියයට 42·4 ක් විය. මෙයද, ප්‍රධාන වශයෙන්ම විමුල්‍යනයෙහි ප්‍රතිඵලයකි; 1970 සැප්තැම්බර් අවසානයේදී, මුළු මුදල් සැපයුමෙහි ඉල්ලුම් තැන්පතු පරිමාව සියයට 43·3 ක්වී.

මුළු ව්‍යවහාර මුදල් නිකුතුවෙහි වැඩි වටිනාකමින් යුත් මුදල් නෝට්ටුවල කොටස් අනුපාතය වැඩිවීම සම්බන්ධයෙන්, පසුගිය වාර්ෂික වාර්තා කීපයක් මගින්ද අවධානය යොමු කෙරිණි. මහජනයා සතු ව්‍යවහාර මුදල් 'දැරීම් සම්බන්ධයෙන් පැවති මෙම උපනතිය 1970 වර්ෂයේදීද, මැයි මාසය අවසානය දක්වා, එලෙසින්ම දක්නට තිබිණි; රුපියල් 100 සහ රුපියල් 50 හේ වටිනාකම් වලින් යුත් මුදල් නෝට්ටු දැරීම් එකතුව රුපියල් දශ ලක්ෂ 63·5 කින් ඉහළ ගිය අතර. මුළු ව්‍යවහාර මුදල් නිකුතුව රුපියල් දශ ලක්ෂ 80·2 කින් වැඩි විය. මැයි සහ ජූලි යන මාසයන් අතරදී, මෙකී ව්‍යවහාර මුදල් නෝට්ටු දැරීම්හි තරමක අඩුවීමක් දක්නට තිබිණි. මේ සම්බන්ධයෙන්, බද්ධ පැහැර හැරීම සහ වැඩි වටිනාකමින් යුත් මුදල් නෝට්ටු රාශිකරණයට විරුද්ධව, රජය මගින් නොයෙකුත් ක්‍රියා මාර්ගයන් (විමුල්‍යනය වැනි) ගනීවිය යන අපේක්ෂාව හේතු වූවා විය හැක. මුළු ව්‍යවහාර මුදල් නිකුතුවෙහි වූ රුපියල් 100 සහ 50 හේ වටිනාකමින් යුත් මුදල් නෝට්ටු කොටස් අනුපාතිකය, මැයි මාසය අවසානයේදී සියයට 63·6 සිට ජූලි මාසය අවසානය වන විට සියයට 58·7 දක්වා පහළ වැටිණි. ඉන්පසු, මෙම මුදල් නෝට්ටු ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවී, නොවැම්බර් මාසය අවසානයේදී, සීග්‍රයෙන් පහළ වැටිණි; ඒ විමුල්‍යනයත් සමගමය.

මුදල් සැපයුමෙහි ව්‍යවහාර මුදල් කොටස් අනුපාතයත්, ව්‍යවහාර මුදල් නිකුතුවෙහි වැඩි වටිනාකමින් යුත් මුදල් නෝට්ටු කොටස් අනුපාතයත් සීග්‍රයෙන් පහළ වැටීම හිතකර වර්ධනයන් ලෙස සැලකිය හැකි නමුදු ඒවා මෙරට මූල්‍ය ක්‍රමයෙහි ස්ථාවර අංගයන් ලෙස පවත්වා ගෙන යාමට හැකිවේද යන්න පිළිබඳ කිසිවක් ප්‍රකාශ කිරීමට තරම් තවම කාලයක් ගතවී නොමැත.

වෙළඳ බැංකු වෙතැති පෞද්ගලික අංශය සතු තැන්පතු පූළුල් වශයෙන් අයිතිය අනුව වර්ග කොට ඒවා ව්‍යාප්තවූ ආකාරය II (ඇ) 6 සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

වෙළඳ ආයතනයන් සතු ඉල්ලුම් තැන්පතු කැපී පෙනෙන සුළු ප්‍රමාණයකින් එනම්, රුපියල් දශලක්ෂ 76·6 කින් වැඩිවිය. 1969 වර්ෂයේදී, ඒවා රුපියල් දශලක්ෂ 28·6 කින් අඩුවී තිබුණි. 1969 දෙසැම්බර් මාසයෙන් අවසන්වූ පසුගිය තුන් වර්ෂය තුළදීම සියයට 8 8 කින් පහළ වැටී තිබුණු මුළු ඉල්ලුම් තැන්පතු එකතුවෙහිවූ වෙළඳ ආයතනයන් සතු ඉල්ලුම් තැන්පතු කොටස් අනුපාතය, 1970 දෙසැම්බර් අවසානයේදී සියයට 4·6 කින් සියයට 18 8 දක්වා ඉහළ ගියේය. එමෙන්ම, පුද්ගලයින් සතු ඉල්ලුම් තැන්පතුද, රුපියල් දශලක්ෂ 74·7 කින් වැඩිවිය. එහෙත් මුළු ඉල්ලුම් තැන්පතු සඳහාවූ ඒවායේ කොටස් අනුපාතය 1969 දෙසැම්බර් අවසානයේදී සියයට 43·1 සිට, 1970 දෙසැම්බර් අවසාන වන විට සියයට 41·0 දක්වා පහළ වැටිණි. 'අනෙකුත් ව්‍යාපාරික' ආයතනයන් සතු ඉල්ලුම් තැන්පතු රුපියල් දශලක්ෂ 25·5 කින් වැඩිවූ අතර, නිෂ්පාදන ආයතනයන් සතු ඉල්ලුම් තැන්පතු රුපියල් දශලක්ෂ 26·6 කින්ද, මූල්‍ය ආයතන සතු ඉල්ලුම් තැන්පතු රුපියල් දශලක්ෂ 14·2 කින්ද වැඩිවිය. ''වැවිලි'' සතු ඉල්ලුම් තැන්පතු රුපියල් දශලක්ෂ 6·7 කින් අඩු විය. අනෙකුත් වර්ගයන් සතු තැන්පතුවල සුළු වැඩිවීම් දක්නට ලැබේ.

## II (ඇ) 6 සංඛ්‍යා සටහන

### වෙළෙඳ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ ඉල්ලුම්, කාලීන හා ඉතුරුම් තැන්පතු අයිතිය
### (කාලච්ඡේදය අවසානයේදී)

රුපියල් දශලක්ෂ වලිනි.

| අයිතිය | ඉල්ලුම් | | කාලීන | | ඉතුරුම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| **මූල්‍ය ආයතන** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 41·9 | 5·5 | 122·5 | 22·2 | 14·1 | 3·8 | 178·5 | 10·6 |
| 1970 මාර්තු .. | 42·4 | 5·6 | 127·0 | 23·4 | 14·5 | 3·7 | 184·0 | 10·9 |
| 1970 ජුනි .. | 48·6 | 5·9 | 125·1 | 24·9 | 14·7 | 3·5 | 188·3 | 10·8 |
| 1970 සැප්තැම්බර් .. | 54·3 | 6·3 | 121·5 | 23·6 | 14·1 | 3·2 | 189·9 | 10·4 |
| 1970 දෙසැම්බර් .. | 56·1 | 5·7 | 135·3 | 24·0 | 16·3 | 3·0 | 207·7 | 10·0 |
| **වැවිලි** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 63·5 | 8·3 | 53·8 | 9·7 | 0·3 | 0·1 | 117·6 | 7·0 |
| 1970 මාර්තු .. | 70·9 | 9·3 | 52·9 | 9·7 | 0·3 | 0·1 | 124·1 | 7·3 |
| 1970 ජුනි .. | 59·7 | 7·3 | 36·5 | 7·3 | 0·3 | 0·1 | 96·6 | 5·6 |
| 1970 සැප්තැම්බර් .. | 61·9 | 7·2 | 38·3 | 7·4 | 0·4 | 0·1 | 100·6 | 5·5 |
| 1970 දෙසැම්බර් .. | 56·8 | 5·8 | 42·1 | 7·5 | 0·3 | 0·1 | 99·2 | 4·8 |
| **වෙළෙඳ** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 108·5 | 14·2 | 126·0 | 22·8 | 5·0 | 1·[illegible] | 239·5 | 14·2 |
| 1970 මාර්තු .. | 119·7 | 15·8 | 93·9 | 17·3 | 5·0 | 1·3 | 218·6 | 12·9 |
| 1970 ජුනි .. | 138·4 | 16·9 | 85·5 | 17·0 | 5·1 | 1·2 | 229·1 | 13·2 |
| 1970 සැප්තැම්බර් .. | 158·2 | 18·3 | 85·3 | 16·6 | 5·4 | 1·2 | 248·9 | 13·7 |
| 1970 දෙසැම්බර් .. | 185·1 | 18·8 | 94·6 | 16·8 | 6·4 | 1·2 | 286·1 | 13·7 |
| **නිෂ්පාදන ආයතන** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 72·3 | 9·5 | 38·0 | 6·9 | 0·2 | 0·1 | 110·6 | 6·6 |
| 1970 මාර්තු .. | 62·0 | 8·2 | 39·8 | 7·3 | 0·3 | 0·1 | 102·1 | 6·0 |
| 1970 ජුනි .. | 63·6 | 7·8 | 42·1 | 8·4 | 0·2 | ... | 105·9 | 6·1 |
| 1970 සැප්තැම්බර් .. | 85·4 | 9·9 | 42·6 | 8·3 | 0·3 | 0·1 | 128·3 | 7·1 |
| 1970 දෙසැම්බර් .. | 98·9 | 10·0 | 41·7 | 7·4 | 0·4 | 0·1 | 141·0 | 6·8 |
| **අනෙකුත් ව්‍යාපාර** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 81·5 | 10·7 | 41·9 | 7·6 | 2·6 | 0·7 | 125·9 | 7·5 |
| 1970 මාර්තු .. | 88·1 | 11·6 | 48·9 | 9·0 | 3·7 | 0·9 | 140·7 | 8·3 |
| 1970 ජුනි .. | 93·6 | 11·5 | 38·0 | 7·6 | 4·9 | 1·2 | 136·6 | 7·9 |
| 1970 සැප්තැම්බර් .. | 89·8 | 10·4 | 37·6 | 7·3 | 5·7 | 1·3 | 133·1 | 7·3 |
| 1970 දෙසැම්බර් .. | 107·0 | 10·9 | 50·7 | 9·0 | 8·2 | 1·5 | 165·9 | 8·0 |
| **ප්‍රාදේශීය බලමණ්ඩල** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 15·8 | 2·1 | 13·3 | 2·4 | 0·2 | 0·1 | 29·2 | 1·7 |
| 1970 මාර්තු .. | 12·7 | 1·7 | 12·5 | 2·3 | 0·2 | 0·1 | 25·4 | 1·5 |
| 1970 ජුනි .. | 11·2 | 1·4 | 11·7 | 2·3 | 0·2 | ... | 23·2 | 1·3 |
| 1970 සැප්තැම්බර් .. | 14·3 | 1·6 | 12·0 | 2·3 | 0·2 | ... | 26·5 | 1·5 |
| 1970 දෙසැම්බර් .. | 16·9 | 1·7 | 12·2 | 2·2 | 0·2 | ... | 29·3 | 1·4 |
| **ව්‍යාපාර නොවන ආයතන** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 50·3 | 6·6 | 35·9 | 6·5 | 6·3 | 1·7 | 92·6 | 5·5 |
| 1970 මාර්තු .. | 50·8 | 6·7 | 41·4 | 7·6 | 5·9 | 1·5 | 98·1 | 5·8 |
| 1970 ජුනි .. | 52·9 | 6·5 | 43·9 | 8·7 | 6·3 | 1·5 | 103·0 | 5·9 |
| 1970 සැප්තැම්බර් .. | 54·5 | 6·3 | 48·4 | 9·4 | 6·3 | 1·4 | 109·2 | 6·0 |
| 1970 දෙසැම්බර් .. | 59·7 | 6·1 | 54·2 | 9·6 | 7·8 | 1·5 | 121·7 | 5·8 |
| **පුද්ගලයන්** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 328·9 | 43·1 | 121·2 | 21·9 | 342·7 | 92·2 | 792·8 | 47·0 |
| 1970 මාර්තු .. | 311·9 | 41·1 | 126·1 | 23·2 | 357·7 | 92·3 | 795·8 | 47·1 |
| 1970 ජුනි .. | 348·2 | 42·7 | 119·0 | 23·7 | 386·6 | 92·4 | 853·8 | 49·2 |
| 1970 සැප්තැම්බර් .. | 345·4 | 40·0 | 129·3 | 25·1 | 408·7 | 92·7 | 883·4 | 48·5 |
| 1970 දෙසැම්බර් .. | 403·6 | 41·0 | 132·4 | 23·5 | 496·0 | 92·6 | 1,032·0 | 49·5 |
| **එකතුව** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 762·7 | 100·0 | 552·6 | 100·0 | 371·5 | 100·0 | 1,686·8 | 100·0 |
| 1970 මාර්තු .. | 758·6 | 100·0 | 542·5 | 100·0 | 387·7 | 100·0 | 1,688·8 | 100·0 |
| 1970 ජුනි .. | 816·3 | 100·0 | 501·9 | 100·0 | 418·4 | 100·0 | 1,736·6 | 100·0 |
| 1970 සැප්තැම්බර් .. | 863·9 | 100·0 | 515·0 | 100·0 | 441·1 | 100·0 | 1,820·0 | 100·0 |
| 1970 දෙසැම්බර් .. | 984·1 | 100·0 | 563·1 | 100·0 | 535·6 | 100·0 | 2,082·8 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1970 දී, මහජනයා සතු ද්විතීයික ද්‍රවශීල වත්කම් වැඩිවූ ප්‍රමාණයෙන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් වෙළඳ බැංකු වෙතවූ කාලීන හා ඉතුරුම් තැන්පතු වලින් යුක්ත විය. 1969 දී, රුපියල් දශලක්ෂ 102·6 කින් වැඩිවී තිබුණු කාලීන තැන්පතු, 1970 වර්ෂයේදී ඉහළ ගියේ මඳ වශයෙනි; එනම් රුපියල් දශලක්ෂ 19·5 කින් පමණි. අනෙක් අතට, ඉතුරුම් තැන්පතු 1970 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 159·2 කින් වැඩිවුණි. ඉකුත් වර්ෂයේදී ඒවා වැඩිවී තිබුණේ රුපියල් දශලක්ෂ 55·5 කිනි. මෙවර කාලීන තැන්පතුවල අඩු වර්ධන වේගය කෙරෙහි බැංකු නොවන පෞද්ගලික අංශයේ රාජ්‍ය පත්‍ර දැරීම් වැඩිවීමත්, කුලී පිට ගැනුම් මූල්‍ය සමාගම් වෙතවූ පෞද්ගලික තැන්පතු වැඩිවීමත්, හේතු සාධක වූවා විය හැක. මෙසේ 1970 වර්ෂයේදී කාලීන තැන්පතු සම්බන්ධයෙන් අඩු වර්ධන වේගයක් දැකිය හැකි වුවද එම තැන්පතුවල ස්ථායීතාව එලෙසින්ම පවත්වා ගැණිනි. කාලීන තැන්පතු සඳහාවූ පිරිවැටුම් අනුපාතිකයෙහි මාසික සාමාන්‍ය 1969 වර්ෂයේදී, 0·19 සිට 1970 වර්ෂයේදී 0·18 දක්වා පහළ වැටිණි; ඉතුරුම් තැන්පතු සඳහාවූ පිරිවැටුම් අනුපාතිකය 0·09 යෙහි නොවෙනස්ව පැවතිණි. වෙළඳ බැංකු වෙතවූ ඉතුරුම් තැන්පතු සැළකිය යුතු අන්දමින් වැඩිවීම කෙරෙහි විමුල්‍යනය බෙහෙවින්ම හේතු වූවා යයි සිතිය හැක.

වෙළඳ බැංකු වෙතවූ කාලීන තැන්පතු වැඩිවීම, ප්‍රධාන වශයෙන්ම මූල්‍ය ආයතන (ප්‍රධාන කොටම අර්ථසාධක අරමුදල්) හා ව්‍යාපාරික නොවන අයතනයන්හි තැන්පතු තුළින් පිළිබිඹු වෙයි. පුද්ගලයින් සතු කාලීන තැන්පතුද වැඩිවූ අතර, අනෙකුත් වර්ගයනට අයත් හිමිකරුවන් සතු තැන්පතුවල අඩුවීමක් හෝ ඉතා සුළු වැඩිවීමක් හෝ දැකිය හැක. කැපී පෙනෙන සුළු අඩුවීමක් දක්නට තිබුණේ වෙළඳ ආයතනායන් සතු කාලීන තැන්පතුවලය. ඉතුරුම් තැන්පතුවලවූ වැඩිවීම සම්පූර්ණයෙන්ම පාහේ ඇති වූයේ පුද්ගලයින් සතු තැන්පතු සම්බන්ධයෙනි.

නිල ආයතනයන් වෙතවූ ඉතුරුම් තැන්පතු සැලකිල්ලට ගත් විට, තැපැල් කාර්යාලයීය ඉතිරි කිරීමේ බැංකුව වෙතවූ තැන්පතු සැලකිය යුතු ප්‍රමාණයකින්, එනම් රුපියල් දශලක්ෂ 83·7 කින් වැඩිවී ඇති බව පෙනේ. එය මුළුමනින්ම පාහේ විමුල්‍යනය නිසා සිදුවූවකැයි කිව හැක. ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතවූ ඉතුරුම් තැන්පතු රුපියල් දශලක්ෂ 6·6 කින් වැඩිවූ අතර, ඉතුරුම් සහතික පත් රුපියල් දශලක්ෂ 12·5 කින් අඩු විය. වෙළඳ බැංකු, ලංකා ඉතිරි කිරීමේ බැංකුව සහ තැපැල් කාර්යාලයීය ඉතිරි කිරීමේ බැංකුව විසින් ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොළී අනුපාතිකයත්, පසුගිය වර්ෂ කිහිපය තුළදී වරින්වර වැඩි කොට තිබියදී ඉතුරුම් සහතික පත් සඳහා ගෙවන පොළී අනුපාතිකය වර්ෂ කිහිපයක් මුළුල්ලේම නොවෙනස්ව පැවතීම, ඒවා අඩුවීමට හේතු වූවා විය හැක.

නිල ආයතනයන් වෙතවූ තැන්පතු වැඩිවීම, විමුල්‍යනය නොකෙළේ නම්, එතරම් වැදගත් නොවන්නට ඉඩ තිබුණි. එසේ කිව හැක්කේ මෙම ආයතනයන්ට, වෙළඳ බැංකු හා පෞද්ගලික අංශයේ තැන්පතු භාර ගන්නා මූල්‍ය ආයතන වෙතින් මුහුණ පෑමට සිදුවූ තියුණු තරඟය හේතුවෙනි.

1970 වර්ෂයේදී, පෞද්ගලික අංශය සතු රාජ්‍ය පත්‍ර දැරීම්හි සැලකිය යුතු වැඩිවීමක් දක්නට තිබිණි. භාණ්ඩාගාර බිල්පත්, බදු සංචිත සහතික පත් සහ රාජ්‍ය පිළිනපත් දැරීම්හි මුළු එකතුව රුපියල් දශලක්ෂ 111·8 කින් ඉහළ ගියේය. ඉකුත් වර්ෂයේදී ඒවා වැඩිවූයේ රුපියල් දශලක්ෂ 60·7 කිනි. භාණ්ඩාගාර බිල්පත් දැරීම් රුපියල් දශලක්ෂ 2·7 කින් අඩුවූ අතර, බදු සංචිත සහතික පත් සහ රාජ්‍ය පිළිනපත් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 27·7 කින් සහ රුපියල් දශලක්ෂ 86·8 කින් වැඩිවී. රක්ෂණ සංස්ථාව සතු රාජ්‍ය පිළිනපත් දැරීම් රුපියල් දශලක්ෂ 45·9 කින් වැඩිවීම නිසා පෞද්ගලික අංශයේ රාජ්‍ය පත්‍ර දැරීම් වැඩිවූ ප්‍රමාණයෙන් අඩකටත් වඩා එම ආයතනය සතු විය. භාරකාර, සුභසාධක, විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල් (සේවක අර්ථසාධක අරමුදලහැර) සතු රාජ්‍ය පිළිනපත් දැරීම රුපියල් දශලක්ෂ 38·2 කින් වැඩිවිය. 1969 වර්ෂයේදී ඒවා රුපියල් දශලක්ෂ 26·0 කින් වැඩිවී තිබුණි. අනෙකුත් අයවලුන් සතු ඒවා රුපියල් දශලක්ෂ 2·1 කින් පහළ වැටිණි.

සංක්ෂිප්ත වශයෙන් දක්වතොත්, 1970 වර්ෂයේදී ද්විතීයික ද්‍රවශීල වත්කම්හි සැලකිය යුතු වර්ධනයක් දැකිය හැක. ඉකුත් වර්ෂයට වඩා, ද්විතීයික ද්‍රවශීල වත්කම් වැඩිවූ ප්‍රමාණයෙන් වැඩි සමානුපාතයක් රජය වෙතැති හිමිකම් ස්වරූපයෙන් විය. 1970 වර්ෂයේදී, බැංකු නොවන පෞද්ගලික අංශයෙහි රාජ්‍ය පත්‍ර දැරීම වැඩිවීම, ද්විතීයික ද්‍රවශීල වත්කම් වැඩිවූ මුළු ප්‍රමාණයෙන් සියයට 30·2 ක් විය. ඉකුත් වර්ෂයේදී එය සියයට 25·6 ක් විය. කෙසේ වුවද, රාජ්‍ය පත්‍ර දැරීම් විශේෂයෙන්ම, රාජ්‍ය පිළිනපත් තවදුරටත්, සම්පූර්ණයෙන්ම පාහේ ආයතනික ආයෝජකයනට සීමාවෙමින් පවතී. පෞද්ගලික අංශයේ සියළුම මූල්‍ය වත්කම්හි එකතුව ගත් විට, දළ ජාතික නිෂ්පාදිතය සඳහාවූ ඒවායේ අනුපාතය සියයට 42·7 ක් විය. 1969 වර්ෂයේදී එය සියයට 41·9 ක් වූයේය.

4. පොළී අනුපාතික

1970 ජනවාරි 11 වෙනි දින, මහ බැංකු පොළිය සියයට 5½ සිට 6½ දක්වා වැඩි කෙරිණි. වාණිජ හා නිෂ්පාදන ණය සම්බන්ධයෙන්, භාවිතීය පොරොන්දු නෝට්ටු මත දෙනු ලබන අත්තිකාරම් සඳහා මහ බැංකු පොළී අනුපාතිකය ද සියයට 6½ දක්වා වැඩි විය. මැදි හා දිගු කාලීන ණය අරමුදල යටතේ ණය දෙන ආයතනවලට සැපයෙන මහ බැංකු ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සඳහා වූ පොළී අනුපාතිකය ද 1970 ජනවාරි මාසයේදී ඉහළ නැංවිණි. කෘෂිකර්මීය හා කර්මාන්ත නංවාලීමට හෝ වර්ධනය සඳහා දෙනු ලබන ණය මුදල් ප්‍රමාණයන්ට අය කරනු ලබන පොළිය සියයට 5½ සිට 6½ දක්වාද, වෙළඳම, වාණිජ හෝ ව්‍යාපාර නැංවීමට හෝ වර්ධනය සඳහා වූ ණය සම්බන්ධයෙන් අය කෙරෙන පොළිය සියයට 6½ සිට 7½ දක්වාද ඉහළ නංවන්නට යෙදුණි. තේ කර්මාන්තශාලා නවීකරණයට සහ හෝ අළුතින් තේ කර්මාන්තශාලා ඉදි කිරීම සඳහා හෝ දෙනු ලබන ප්‍රති මූල්‍ය ණය පහසුකම් සම්බන්ධයෙන් දේශීය වියදම් පියවා ගැනීම සඳහා වූ ණයවලට අය කෙරෙන පොළිය සියයට 5 ක්ද, විදේශීය විනිමය වියදම් පියවා ගැනීම සඳහා වූ ණයවලට අය කෙරෙන පොළිය සියයට 7 ක්ද වශයෙන්, පොළී අනුපාතිකය නොවෙනස්ව පැවතුණි. කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය යටතේ මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය ණය පොළී අනුපාතිකය සියයට 1½ ක්ව නොවෙනස්ව පැවැති අතර, සහතික මිළ ක්‍රමය යටතේ වී මිලදී ගැනීමටත්, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදිතයන් මිළට ගැනීම, අලෙවිය හෝ ගබඩා කිරීමටත් සමුපකාරවලට අත්තිකාරම් දීම සඳහා, වෙළඳ බැංකුවලට දෙන අත්තිකාරම සම්බන්ධයෙන් අය කෙරෙන පොළිය 1970 දීත් සියයට 3 ක්ව පැවතිණ.

මහ බැංකු පොළී ප්‍රමාණය වැඩිවීමත් සමගම වෙළඳ බැංකු ණය දීමේදී අය කෙරෙන සියළුම පොළී අනුපාතිකයන්, 1970 ජනවාරියේදී වැඩි විය. රජයේ සුරැකුම්පත් වෙනුවෙන් දෙනු ලබන අත්තිකාරම්වල අවම සහ උපරිම පොළී අනුපාතිකයන්, පිළිවෙලින් සියයට 5¾ සිට සියයට 7 දක්වා සහ සියයට 8½ සිට සියයට 9½ දක්වා වෙනස් විය. මිළදී ගත් බිල්පත් සඳහා උපරිම පොළිය සියයට 9 සිට 10 දක්වාද, අවම පොළිය සියයට 5½ සිට සියයට 6½ දක්වාද වැඩි විය. වෙළඳ තොග ඇපයට ගෙන දෙනු ලබන ණය සම්බන්ධයෙන්, උපරිම පොළිය සියයට 11 සිට සියයට 12 දක්වාද, අවම පොළිය සියයට 7½ සිට සියයට 8½ දක්වාද ඉහළ නැගුණි. බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් සහ නිශ්චල දේපල මත දෙන ණය සඳහා උපරිම සහ අවම පොළී අනුපාතිකයන් පිළිවෙලින් සියයට 10 සිට 11 දක්වා සහ සියයට 7 සිට සියයට 8 දක්වා සියයට එකකින් වැඩි විය. අනිකුත් වර්ගයේ සුරැකුම් ඇප කොට දෙනු ලබන අත්තිකාරම් වෙනුවෙන් උපරිම පොළිය සියයට 11 සිට සියයට 12 දක්වාද, අවම පොළිය සියයට 6 සිට සියයට 6½ දක්වාද වැඩි විය. ඇප නොළත් ණය මුදල් සඳහා අවම පොළිය සියයට 7½ සිට සියයට 8½ දක්වාද, උපරිම පොළිය සියයට 11 සිට සියයට 12 දක්වාද ඉහළ ගියේය.

1970 ජනවාරියේදී සියළුම වෙළඳ බැංකු මගින්, ඒවායේ තැන්පතු අනුපාතිකයන් ඉහළ නංවන ලදී. ඉතුරුම් තැන්පතුවලට ගෙවන පොළිය සියයට 3¾ සිට සියයට 4½ දක්වා ඉහළ ගියේය. සෑම කාලච්ඡේදයකම වූ කාලීන තැන්පතු සඳහා පොළී ප්‍රමාණය සියයට හතරෙන් තුනකින් වැඩි විය. මේ සම්බන්ධයෙන් කාලීන තැන්පතු ඒවායේ ප්‍රමාණයන්

අනුව ප්‍රධාන කොටස් 3 කට බෙදා දැක්වෙයි එනම්; රුපියල් 5,000 ට අඩු, රුපියල් 5,000 හා ඊට වැඩි, එහෙත් රුපියල් 25,000 ට අඩු සහ රුපියල් 25,000 සහ ඊට වැඩි යනුවෙනි. මෙම තැන්පතු පන්තීන් සඳහා පොළී ප්‍රමාණය සියයට හතරෙන් එකක අන්තරයක් සහිතව වෙනස් වේ. ඒ අනුව රු. 5,000 ට අඩු මාස 36 ක කාල සීමාවක් ඉක්මවන තැන්පතු සඳහා ගෙවන පොළී ප්‍රමාණය සියයට $5\frac{1}{4}$ කි. රුපියල් 5,000 සහ ඊට වැඩි එහෙත් රුපියල් 25,000 ට අඩු තැන්පතුවලට සියයට $5\frac{1}{2}$ කි. රුපියල් 25,000 ට හා ඊට වැඩි තැන්පතුවලට සියයට $5\frac{3}{4}$ කි. අවසානයෙහි සඳහන් කළ පොළී අනුපාතිකය, වෙළඳ බැංකු වලින් කාලීන තැන්පතු සඳහා ලබාගත හැකි ඉහළම පොළී ප්‍රමාණයයි.

ලංකා ඉතිරි කිරීමේ බැංකුවෙහි ස්ථාවර තැන්පතු පොළී අනුපාතිකය මාස 3 සිට 6 දක්වා තැන්පතු සඳහා සියයට 3 ක්ද, මාස 6 සිට 9 දක්වා තැන්පතු වලට සියයට $3\frac{1}{2}$ ක්ද, මාස 9යේ සිට මාස 11 දක්වා තැන්පතුවලට සියයට 4 ක්ද, මාස 12 තැන්පතුවලට සියයට $4\frac{1}{2}$ ක්ද වශයෙන් නොවෙනස්ව පැවති අතර, භාර ගන්නා ස්ථාවර තැන්පතු අවමය රුපියල් 25,000 ක්වම පැවතිණ. 1970 ජනවාරියේදී ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොළී අනුපාතිකය සියයට $3\frac{1}{2}$ සිට 4 දක්වා ඉහළ ගියේය. තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවේ ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොළියත් එම මාසයේදීම සියයට 3.0 සිට සියයට 3·6 දක්වා වැඩි විය.

දිගු කාලීන ණය දෙන ආයතනයන්හි ණය දීමේ අනුපාතිකයන් ද 1970 දී වෙනස් කරන ලදී. කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනය මගින් නිශ්චල දේපළ ඇපයට ගෙන සංවර්ධන අරමුණු සඳහා දෙන ණය සම්බන්ධයෙන් අයකරන පොළිය 1970 පෙබරවාරියේදී සියයට $7\frac{1}{2}$ සිට සියයට $8\frac{1}{2}$ දක්වාද, යළිත් ඔක්තෝබර් මාසයේදී සියයට 9 දක්වාද වැඩි කරන්නට යෙදුනි. චංචල දේපළ ඇපයට ගනිමින් සංවර්ධන අරමුණු සඳහා දෙන ණයවලට මෙම ආයතනය මගින් 1970 පෙබරවාරියේ සිට සියයට 10 ක පොළියක් අයකරන ලදී. නිශ්චල දේපොල ඇප කොටගත් අනිකුත් ණය සඳහා වූ පොළී ප්‍රමාණය 1970 පෙබරවාරියේදී සියයට $8\frac{1}{2}$ සිට සියයට $9\frac{1}{2}$ දක්වාද, යළිත් 1970 ඔක්තෝබර් මාසයේදී සියයට 10 ක් දක්වා ද වැඩි කරන ලදී. චංචල දේපළ ඇපයට ගනිමින් දෙනු ලබන මෙම වර්ගයේම ණය සඳහා වූ පොළිය 1970 පෙබරවාරි මාසයේදී සියයට 12 ක් වශයෙන් නියම කරන ලදී. ලංකා ඉතිරි කිරීමේ බැංකුවද එහි ණය දීමේ අනුපාතිකයන්, 1970 නොවැම්බරයේදී වැඩි කරන්නට යෙදුනි. එනම්, ගොඩනැගිලි ණය සම්බන්ධයෙන් වූ සම පොළී අනුපාතිකය, සියයට 7 ක සිට සියයට 10 දක්වාද, අනිකුත් ණය සම්බන්ධයෙන් සියයට 12 දක්වාද වශයෙනි. මහ බැංකුව මගින් ප්‍රතිමූල්‍ය කෙරෙන මුදල් ණයට දීමේදී, සංවර්ධන මූල්‍ය සමායතනය මගින් අය කෙරෙන පොළියද ජනවාරි මාසයේදී සියයට $8\frac{1}{2}$ සිට $9\frac{1}{2}$ දක්වා වැඩි කරන ලදී. අනිකුත් සෑම ණය දීමක් සම්බන්ධයෙන්ම අය කෙරෙන පොළියත් එම මාසයේදීම සියයට $9\frac{1}{2}$ සිට සියයට 10 දක්වා වැඩි කරන්නට යෙදුනි. විදේශීය ව්‍යවහාර මුදල් ණය සඳහා වූ පොළියද සියයට 10 සිට $10\frac{1}{2}$ දක්වා වැඩි කරන ලදී. රජයේ උකස් බැංකුව මගින් 1969 මැයි මාසයේදී අරඹන ලද තේ නැවත වගා කිරීමේ යෝජනා ක්‍රමය යටතේ ණය දීමේදී, ඉඩම් ඇපයට ගෙන දෙන ලද ණය සඳහා වූ පොළිය සියයට 5 ක්ද, අනිකුත් වර්ගයේ සුරැකුම්පත දෙන ලද ණය සඳහා වූ පොළිය සියයට 7 ක්ද වශයෙන්, පොළී අනුපාතිකයන් නොවෙනස්ව පවත්වා ගති. එහෙත් මෙම ආයතනයෙහි අනිකුත් හැම ණය දීමක් සම්බන්ධයෙන්ම අය කෙරෙන පොළිය 1970 ජනවාරියේදී වැඩි කරන ලදී. උපරිම අනුපාතිකය සියයට $9\frac{1}{2}$ සිට සියයට 10 දක්වා වැඩි විය.

භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය 1969 දෙසැම්බර් මාසයේදී සියයට 4.10 ක් විය. 1970 ජනවාරියේදී එය සියයට 4.12 දක්වාද, පෙබරවාරියේදී සියයට 4·64 දක්වාද, මාර්තුවේදී තවදුරටත් සියයට 4·76 දක්වාද වැඩි විය. එතැන් සිට මේ දක්වා එම මට්ටමෙහිම නොවෙනස්ව පැවතිණි. රජයේ සුරැකුම්පත් සඳහා පොළී අනුපාතිකය ද 1970 දී වැඩි කරන ලදී. අවුරුදු 21 කට වඩා වැඩි කාලයක පරිණත වීමක් ඇති පිළිනපත් සඳහා වූ පොළිය ජනවාරියේදී සියයට $5\frac{1}{2}$ සිට සියයට $6\frac{1}{2}$ දක්වා වැඩි කළ අතර, 1970 මාර්තුවේ සිට සියයට $6\frac{1}{2}$ ක පොළී අනුපාතිකයක් සමග අවුරුදු 12 සිට 15 දක්වා වන කල් පිරීමක් ඇති පිළිනපත් නිකුත් කෙරිණි. අවුරුදු 5 සිට 7 දක්වා වූ පිළිනපත් සඳහා පොළී ප්‍රමාණය නොවැම්බර් මාසයේදී සියයට $4\frac{1}{2}$ සිට සියයට 9 දක්වා වැඩි විය.

## (ආ) 1. වෙළඳ බැංකු කටයුතු - ප්‍රධාන උපනතීන්

1970 වර්ෂයේදී මුදල් සැපයුම රුපියල් දශලක්ෂ 83·5 කින් වැඩි වූ අතර, මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 148·8 කින් අඩු විය. ඒ අනුව වෙළඳ බැංකුවල සම්පත් ප්‍රමාණයෙහි වැඩිවීමක් ඇති වුනි. කෙසේ වුවද, මහජනයා අතැති මුදල් ප්‍රමාණයෙහි අඩුවීමක් වර්ෂයේ අවසාන තුන් මාසය තුළදී සිදු විය. ඒ විමුල්‍යානයෙහි ප්‍රතිඵලයක් වශයෙනි. වසරේ මුල් මාස නවය තුළදී මුදල් සැපයුම, රුපියල් දශ ලක්ෂ 182·9 කින් වැඩි වූයේ, ව්‍යාවහාර මුදල් දැරීම් රුපියල් දශ ලක්ෂ 86·8 කින් වැඩිවීමත් සමඟය.

වර්ෂයේ පළමු මාස අට තුළදී වෙළඳ බැංකුවල සම්පත් සඳහා ප්‍රධාන වශයෙන්ම රජයෙන් සහ සමුපකාරවලින් පැවැති ඉල්ලුමෙහි වැඩිවීමක් විය. එම නිසා වෙළඳ බැංකුවලට මහ බැංකුවෙන් ගන්නා ණය ප්‍රමාණයන් වැඩිකරලීමට සිදු වුනි. ඉකුත් වසරේ අනුරූප කාල සීමාවෙහි සාමාන්‍ය වූ රුපියල් දශ ලක්ෂ 124·1 ක් හා සසඳන කල මෙම වර්ෂයේ පළමු අට මාසය තුළදී එවැනි ණය ගැනීම්හි නොපියවා පැවැති මාසික සාමාන්‍යය මට්ටම රුපියල් දශ ලක්ෂ 225·0 කි. ප්‍රධාන වශයෙන් ම විමුල්‍යානය නිසාත්, සමුපකාරවලට දෙන ලද බඩු තොග කුවිතාන්සි අත්තිකාරම්වලින් සැළකිය යුතු ප්‍රමාණයක් රජය මගින් සැප්තැම්බර් මාසයේදී ආපසු ගෙවීම නිසාත්, වෙළඳ බැංකුවල ද්‍රවශීලතා තත්ත්වයෙහි හටගත් සැලකිය යුතු දියුණුවක් සමග මහ බැංකුව වෙත වූ ඔවුන්ගේ ණයගැති භාවය අඩුකර ගැනීමට වෙළඳ බැංකු සමත් විය එවැනි ණය ගැනීම් හි නොපියවා තිබූ ශේෂය අගෝස්තු අවසානයේදී රුපියල් දශ ලක්ෂ 265·1 සිට දෙසැම්බර් මාසය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 148·8 දක්වා අඩු විය.

## 2. ශාඛා ව්‍යාප්තිය

1963 - 70 කාලසීමාව තුළ ලාංකික සහ විදේශීය බැංකු අතර බැංකු කාර්යාල සහ බැංකු තැන්පතු බෙදී ගිය ආකාරය II (ඇ) 7 සංඛ්‍යා සටහනෙහි දක්වේ.

### II (ඇ) 7 සංඛ්‍යා සටහන

**1963 හා 1970 අතර කාලයේදී බැංකු කාර්යාල සහ බැංකු තැන්පතු ව්‍යාප්තවූ ආකාරය**

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | එකතුව | | | ලාංකික බැංකු | | | බ්‍රිතාන්‍ය බැංකු | | | ඉන්දියානු සහ පකිස්ථානු බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | |
| | | ප්‍රමාණය රු. ද. ලක්ෂ | % | | ප්‍රමාණය රු. ද. ලක්ෂ | % | | ප්‍රමාණය රු. ද. ලක්ෂ | % | | ප්‍රමාණය රු. ද. ලක්ෂ | % |
| 1963 | 83 | 1,301 | 100 | 67 | 801 | 61 | 12 | 412 | 32 | 4 | 88 | 7 |
| 1964 | 88 | 1,447 | 100 | 72 | 943 | 65 | 12 | 415 | 29 | 4 | 90 | 6 |
| 1965 | 97 | 1,546 | 100 | 81 | 1,023 | 66 | 12 | 431 | 28 | 4 | 92 | 6 |
| 1966 | 105 | 1,502 | 100 | 89 | 1,003 | 67 | 12 | 419 | 28 | 4 | 80 | 5 |
| 1967 | 133 | 1,637 | 100 | 117 | 1,157 | 71 | 12 | 404 | 25 | 4 | 76 | 5 |
| 1968 | 141 | 1·808 | 100 | 125 | 1,329 | 73 | 12 | 409 | 23 | 4 | 71 | 4 |
| 1969 | 155 | 1,917 | 100 | 140 | 1,405 | 73 | 11 | 437 | 23 | 4 | 74 | 4 |
| 1970 | 165 | 2,394 | 100 | 152 | 1,831 | 76 | 9 | 472 | 20 | 4 | 91 | 4 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: 1969 සහ 1970 අතර වර්ෂය තුළදී බ්‍රිතාන්‍ය බැංකු සංඛ්‍යාව අඩුවීමට හේතුවූ කරුණු මෙසේය.

1. 1969 වර්ෂයේදී සීමාසහිත ඊස්ටර්න් බැංකුව ලාංකික බැංකුවක් බවට පත්වීම.
2. 1970 වර්ෂයේදී හැටන් නැෂනල් බැංකුව පිහිටුවීම සඳහා නැෂනල් හා ග්‍රින්ලේස් බැංකුවෙහි ශාඛා දෙකක් සහ හැටන් බැංකුව ප්‍රතිසංස්ථාපනය කිරීම.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව 1970 තුළදී ශාඛා ව්‍යාප්තියෙහි තරමක අඩුවීමක් දක්නට තිබුණි. ඉකුත් වසරේ වූ වැඩිවීම 14 කි. මෙවර බැංකු කාර්‍යාල සංඛ්‍යාව 10 කින් වැඩිවී, 1970 අවසානයේදී 165 ක් විය. මහජන බැංකුව ශාඛා 6 ක් විවෘත කළේය. ඒවා රත්නපුර, කටුගස්තොට, කන්තලේ, මොරටුව, ගිරිඋල්ල සහ පූගොඩ යන ස්ථානයන්හි පිහිටුවනු ලැබීය. ලංකා බැංකුව මගින් නව ශාඛා තුනක් බේරුවල, කඩවත සහ කොළඹ විවෘත කරන ලදී. හැටන් බැංකුව සහ නැෂනල් හා ග්‍රීන්ඩ්ලේස් බැංකුවෙහි ශාඛාවන් දෙකක් ඒකාබද්ධ කිරීමෙන් සකසා ගත් අළුතින් ප්‍රතිෂ්ඨාපිත හැටන් නැෂනල් බැංකුවද කොළඹ කාර්‍යාලයක් විවෘත කළේය.

ලංකාවේ විදේශීය බැංකු හැම එකකටම (හබීබ් බැංකුව හැර) දැන් අළුත් ලාංකික ගිණුම් විවෘත කිරීමේ අවසරය දී ඇතත්, මුළු තැන්පතුවලින් ලාංකික බැංකු සතු තැන්පතු කොටස, 1969 අවසානයේදී සියයට 73 සිට 1970අවසානයේදී සියයට 76 ක් දක්වා වැඩිවිය. මෙම කාලසීමාවේදීම බ්‍රිතාන්‍ය බැංකු සතු කොටස් අනුපාතය සියයට 23 සිට සියයට 20 දක්වා අඩු විය. මෙයට තරමක් හේතු වූයේ, හැටන් නැෂනල් බැංකුව ප්‍රතිෂ්ඨාපිත කිරීම සඳහා නැෂනල් සහ ග්‍රීන්ලේස් බැංකුවේ ශාඛා දෙකක් හැටන් බැංකුව සමග ඒකාබද්ධ කිරීමයි.

පෙර වර්ෂයේදී මෙන්ම මෙම වර්ෂයේදීත් වෙළඳ බැංකු වෙතැති කාලීන තැන්පතුවල ඇති වූ වැඩිවීමෙන් ඉතා විශාල කොටසක් සමන්විත වූයේ, විදේශ බැංකු වෙතැති තැන්පතුවලිනි. අනෙක් අතට මුළු ඉල්ලුම් තැන්පතු වැඩිවීමෙන් සියයට 90 ක් පමණ ප්‍රමාණයක් ලාංකික බැංකු සතු විය. එමෙන්ම මුළු ඉතුරුම් තැන්පතු වැඩිවීමෙන් සියයට 90 කටත් වඩා වැඩි ප්‍රමාණයක් අයත් වූයේ ලාංකික බැංකු වලටය.

සියළුම බැංකු සඳහා ඉල්ලුම් තැන්පතු සාමාන්‍යය, 1969 අවසානයේදී රුපියල් 5370 ක සිට 1970 අවසානයේදී රුපියල් 6383 දක්වා වැඩි විය. ඉතුරුම් තැන්පතු සම්බන්ධයෙන් ද ඒවායේ සාමාන්‍යය රුපියල් 999 සිට රුපියල් 1079 දක්වා වැඩි වී තිබුණි. එහෙත් කාලීන තැන්පතු සාමාන්‍යය රුපියල් 44,952 ක සිට රුපියල් 39,147 දක්වා අඩු විය.

## 3. බැංකු වත්කම් සහ වගකීම් ව්‍යුහය.

1959 - 1970 කාලච්ඡේදය සඳහා වාණිජ බැංකුවල ඒකාබද්ධ වත්කම් හා වගකීම්හි තෝරාගත් ශීර්ෂයන් පිළිබඳ සංඛ්‍යා දත්තයන් II (ඇ) 8 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

ඉකුත් වසරේ වූ රුපියල් දශලක්ෂ 221·8 ක වැඩිවීම හා සසඳන කල 1970 දී වෙළඳ බැංකුවල මුළු වත්කම්/වගකීම් රුපියල් දශලක්ෂ 557·7 කින් වැඩිවිය. වගකීම්වල ඇතිවූ වැඩිවීම මූලික වශයෙන්ම සමන්විත වූයේ, තැන්පතු වගකීම් රුපියල් දශලක්ෂ 476·9 කින් වැඩිවීමෙනි: පුද්ගලික අංශයේ තැන්පතු රුපියල් දශලක්ෂ 403·2 කින් වැඩිවූ අතර, රජයේ තැන්පතු රුපියල් දශලක්ෂ 73·7 කින් වැඩිවුනි. වෙළඳ බැංකුවල ප්‍රාග්ධනය හා සංචිත සහ ඒවායේ අනිකුත් වගකීම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 17·8 කින්සහ රුපියල්දශලක්ෂ 57·9 කින් වැඩිවිය. මහ බැංකුවෙන් ණය ගැනීම් රුපියල් දශලක්ෂ 4·3 කින් ඉහළ ගිය අතර, පිටරට බැංකු වලින් ගත් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7·9 කින් අඩුවිය.

ඉල්ලුම් වගකීම්හි සැළකිය යුතු වැඩිවීමක් ඇති වූයේ, ප්‍රධාන වශයෙන්ම විමුල්‍යනය හේතුවෙනි; 1969 දෙසැම්බර් සහ 1970 සැප්තැම්බර් අතර කාලයේදී ඉල්ලුම් වගකීම් වැඩිවීම, රුපියල් දශලක්ෂ 179·6 ක් විය. මහ බැංකුවෙන් ගත් ණය ප්‍රමාණයෙහි සුළු වැඩිවීමක් පමණක් මෙවර ඇති වූයේ, විමුල්‍යනයෙහි ප්‍රතිඵලයක් හැටියට, වෙළඳ බැංකුවල තැන්පතු සම්පත් පරිමාවෙහි වැඩිවීම හේතුවෙනි. 1969 දෙසැම්බර් සහ 1970 අගෝස්තු අතර කාලයේදී මහ බැංකුවෙන් ගත් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 115·0 කින් වැඩිවීය. සහතික මිළ ක්‍රමය යටතේ වී මිලදී ගැනීම සඳහා දෙන ලද ණය සම්බන්ධයෙන් මහ බැංකුව මගින් වෙළඳ බැංකුවලට දුන් ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණයන්, වෙළඳ බැංකු මගින් සැප්තැම්බර් මාසයේදී ආපසු ගෙවීමත් සමගම ඒවායේ ණය ගැනුම්හි

## II (ඇ) 8 සංඛ්‍යා සටහන
## වෙළඳ බැංකුවල වත්කම් හා වගකීම්හි තෝරාගත් ශීර්ෂයන්
(මාසික සංඛ්‍යාවල සාමාන්‍ය අනුවය.)

රුපියල් දශලක්ෂ

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1969 | 1970* | කාලච්ඡේදය අවසානයේදී දෙසැම් 1969 | කාලච්ඡේදය අවසානයේදී දෙසැම් 1970 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අතැති මුදල් සහ මහ බැංකුව වෙතැති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ඇතුළුව) .. .. | 116 | 132 | 148 | 186 | 164 | 182 | 224 | 233 | 218 | 247 | 250 | 248 | 258 | 371 |
| විදේශීය ශේෂ .. .. .. | 52 | 58 | 54 | 55 | 44 | 49 | 55 | 62 | 57 | 72 | 63 | 36 | 52 | 44 |
| භාණ්ඩාගාර බිල්පත් .. .. .. | 24 | 28 | 51 | 89 | 128 | 73 | 89 | 124 | 80 | 102 | 50 | 41 | 45 | 281 |
| වට්ටම් කළ බිල්පත් .. .. .. | 119 | 115 | 122 | 136 | 114 | 126 | 173 | 175 | 198 | 252 | 241 | 275 | 297 | 144 |
| මුළු ද්‍රවශීල වත්කම් .. .. .. | 311 | 333 | 375 | 466 | 450 | 430 | 541 | 594 | 553 | 673 | 604 | 600 | 652 | 840 |
| මුළු ආයෝජන** .. .. .. | 285 | 284 | 290 | 303 | 313 | 330 | 329 | 330 | 300 | 278 | 275 | 263 | 263 | 362 |
| මුළු ණය හා අයිරාවන් .. .. .. | 395 | 430 | 435 | 477 | 495 | 633 | 669 | 682 | 809 | 1000 | 1240 | 1391 | 1363 | 1403 |
| ඉල්ලුම් තැන්පතු† .. .. .. | 655 | 657 | 677 | 829 | 789 | 853 | 917 | 949 | 914 | 955 | 945 | 958 | 928 | 1225 |
| කාලීන හා ඉතුරුම් තැන්පතු .. .. .. | 300 | 340 | 359 | 380 | 460 | 535 | 572 | 631 | 649 | 798 | 915 | 989 | 986 | 1169 |
| මුළු තැන්පතු .. .. .. | 955 | 998 | 1036 | 1209 | 1250 | 1389 | 1490 | 1580 | 1564 | 1755 | 1863 | 1948 | 1917 | 2394 |
| අනුපාතය .. .. .. | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතු සඳහා වූ මුදල් .. .. .. | 17·7 | 20·1 | 21·9 | 22·4 | 20·8 | 21·3 | 24·4 | 24·5 | 23·8 | 25·9 | 26·4 | 25·9 | 27·8 | 30·3 |
| මුළු තැන්පතු සඳහා වූ මුදල් .. .. .. | 12·1 | 13·2 | 14·3 | 15·4 | 13·1 | 13·1 | 15·0 | 14·7 | 13·9 | 14·1 | 13·4 | 12·7 | 13·5 | 15·5 |
| මුළු තැන්පතු සඳහා වූ විදේශීය ශේෂ .. .. .. | 5·4 | 5·8 | 5·2 | 4·5 | 3·5 | 3·5 | 3·7 | 3·9 | 3·6 | 4·1 | 3·4 | 1·8 | 2·7 | 1·8 |
| මුළු තැන්පතු සඳහා වූ භාණ්ඩාගාර බිල්පත් .. .. | 2·5 | 2·8 | 4·9 | 7·4 | 10·2 | 5·3 | 6·0 | 7·8 | 5·1 | 5·8 | 2·7 | 2·1 | 2·3 | 11·7 |
| මුළු තැන්පතු සඳහා වූ වට්ටම් කළ වාණිජ බිල්පත් .. | 12·5 | 11·5 | 11·8 | 11·2 | 9·1 | 9·1 | 11·6 | 11·1 | 12·7 | 14·4 | 12·9 | 14·1 | 15·5 | 6·0 |
| ඉල්ලුම් තැන්පතු සඳහා වූ ද්‍රවශීල වත්කම් .. .. | 47·5 | 50·7 | 55·4 | 56·2 | 57·0 | 50·4 | 59·0 | 62·6 | 60·5 | 70·5 | 63·9 | 62·6 | 70·3 | 68·6 |
| මුළු තැන්පතු සඳහා වූ ද්‍රවශීල වත්කම් .. .. | 32·6 | 33·4 | 36·2 | 38·5 | 36·0 | 31·0 | 36·3 | 37·6 | 35·4 | 38·3 | 32·4 | 30·8 | 34·0 | 35·1 |
| මුළු තැන්පතු සඳහා වූ ආයෝජන .. .. | 29·8 | 28·5 | 28·0 | 25·1 | 25·0 | 23·8 | 22·1 | 20·9 | 19·2 | 15·8 | 14·8 | 13·5 | 13·7 | 15·1 |
| මුළු තැන්පතු සඳහා වූ ණය හා අයිරාවන් .. .. | 41·4 | 43·1 | 42·0 | 39·4 | 39·6 | 45·6 | 44·9 | 43·2 | 51·7 | 57·0 | 66·6 | 71·4 | 71·1 | 58·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* 1970 වර්ෂයේ අවසාන මාස තුන තුළදී වෙළඳ බැංකු වත්කම් හා වගකීම්හි විකෘති ස්වභාවයක් දැකිය හැක්කේ රුපියල් 100 සහ 50 නෝට්ටු විමුල්‍යනයෙහි ප්‍රතිඵලයක් වශයෙනි. ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා වූ සංඛ්‍යාවන්ට අනුව මෙම තීරුවල සංඛ්‍යාවන් ගණනය කර ඇත.

** රජයේ හා රජය මගින් සහතික කළ සුරැකුම් පත්, පෞද්ගලික සුරැකුම්පත් සහ මහ බැංකුවේ නිකුතු.

† දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නැත

(මහ බැංකුවෙන්) නොපියවා ඇති ශේෂය රුපියල් දශලක්ෂ 209·1 ක විශාල ප්‍රමාණය කින් අඩුවීය. එහෙත් විමුල්‍යනයෙන් පසු අළුත් රුපියල් 100 සහ රුපියල් 50 නෝට්ටු හැර ගැනීමේ ප්‍රතිඵලයක් හැටියට, මහ බැංකුවෙන් ගත් වෙළඳ බැංකු ණය ප්‍රමාණයන්හි රුපියල් දශලක්ෂ 336·8 ක අසාමාන්‍ය වැඩිවීමක් වාර්තා විය. විමුල්‍යනය කළ ව්‍යවහාර නෝට්ටු මහ බැංකුවට ආපසු දීමත් සමග, මෙම ණය ගැනුම්හි නොපියවා පැවැති ශේෂය නොවැම්බර් මාසයේදී රුපියල් දශලක්ෂ 278·1 කින් අඩුවුණි.

වත්කම් අංශය ගත් විට, 1952 න් පසු පළමු වතාවට වෙළඳ බැංකු ණය හා අත්තිකාරම් රුපියල් දශලක්ෂ 112·0 කින් අඩුවිය. 1969 දී වූ වැඩිවීම, රුපියල් දශලක්ෂ 336·5 ක් වීය. වෙළඳ බැංකු වෙතවූ ආනයන බිල්පත් පරිමාවෙහි රුපියල් දශලක්ෂ 172·8 ක අඩුවීමක් මෙයට විශාල වශයෙන් හේතුවිය. කාලයක් තිස්සේ වෙළඳ බැංකු වෙත එක්රැස්වී තිබූ, රජයේ ආනයන බිල්පත් ප්‍රමාණයක් ආපසු ගෙවීම, ආනයන බිල් පත්‍ර වල අඩුවීම කෙරෙහි බලපෑ ප්‍රධානතම හේතුවයි. 1970 දී වෙළඳ බැංකු සතු වූ රජයේ ආනයන බිල්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 141·8 කින් අඩුවිය. අයිරාවන්හි නොපියවා පැවැති ශේෂයද රුපියල් දශලක්ෂ 36·9කින් අඩුවූ අතර, ණය සහ අපනයන බිල්පත් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 77·2 කින් සහ රුපියල් දශලක්ෂ 20·6 කින් වැඩිවිය.

මෙම වර්ෂය සමස්ථ වශයෙන් ගත්විට, මෙම කාලයේදී වෙළඳ බැංකුවල මූල්‍ය තත්ත්වය සැලකිය යුතු පරිදි වැඩිවූ බව පෙනේ. 1969 දෙසැම්බර් සහ 1970 දෙසැම්බර් අතර කාලයේදී, මුළු මුදල් දෑරීම (ව්‍යවස්ථාපිත සංචිත ද ඇතුළුව) රුපියල් දශලක්ෂ 112·5 කින් වැඩිවීය; 1970 දෙසැම්බර් අවසානයේදී ඒවා මුළු තැන්පතු වලින් සියයට 15·5 ක් වූ අතර, කලින් වර්ෂයේ දෙසැම්බර් අවසානයේදී එය සියයට 13·5 ක් වීය. මුදල් දෑරීම මේ ආකාරයෙන් වැඩිවීමට හේතු වූයේ, විමුල්‍යනයේ ප්‍රතිඵලයක් වශයෙන්, වසරේ අවසාන තෙමසේදී අසාමාන්‍ය අන්දමින් පැවති ඉහල මට්ටමේ මුදල් දෑරීමයි. 11 (ඇ.) 8 සංඛ්‍යා සටහනෙහි පෙනෙන පරිදි, වසරේ මුල් මාස නවය තුළදී මුදල් දෑරීම්හි සාමාන්‍යය මාසික මට්ටම ඉකුත් වසරේ මට්ටමට වඩා අඩුවූ බව පෙනේ. මෙම කාලයේදී මුළු තැන්පතු සඳහා පැවැති මුදල් ප්‍රමාණයෙහි සාමාන්‍ය මාසික අනුපාතයද 1969 සියයට 13·4 ක සිට සියයට 12·7 දක්වා අඩුවීය.

වෙළඳ බැංකුවල මුළු ද්‍රවශීල වත්කම් රුපියල් දශලක්ෂ 188 කින් වැඩිවිය. මුළු තැන්පතු සඳහාවූ ද්‍රවශීල වත්කම් අනුපාතය 1969 දෙසැම්බර් අවසානයේදී සියයට 34·0 ක සිට 1970 දෙසැම්බර් අවසානයේදී සියයට 35·1 දක්වා වැඩිවීය. ද්‍රවශීල වත්කම්හි ඇතිවූ වැඩිවීම සමන්විත වූයේ මුදල් දෑරීම් රුපියල් දශලක්ෂ 112·5 කින් සහ භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශලක්ෂ 236·5 කින් වැඩිවීමෙනුත්, වට්ටම් කළ බිල්පත් සහ විදේශීය ශේෂයන් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 152·2 කින් හා රුපියල් දශලක්ෂ 8·4 කින් අඩුවීමෙනුත්ය.

වෙළඳ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයද සැළකිය යුතු අන්දමින් වැඩිවීය. ඒවා මුළු තැන්පතු වල අනුපාතිකයක් හැටියට ගත්විට, 1969 දෙසැම්බර් අවසානයේදී සියයට 2·3 සිට 1970 දෙසැම්බර් අවසානයේදී සියයට 11·7 දක්වා ඉහළ ගියේය. මෙයද ප්‍රධාන වශයෙන්ම විමුල්‍යනයෙන් පසුව, බැංකුවල සම්පත් වැඩිවීමේ ප්‍රතිඵලයකි. මෙම වසරේ මුල් මාස නවය සඳහා භාණ්ඩාගාර බිල්පත් දෑරීම්හි මාසික සාමාන්‍යය, රුපියල් දශලක්ෂ 41 ක් හෙවත්, මුළු තැන්පතුවලින් සියයට 2·1 ක් විය ඉකුත් වර්ෂයේදී මාසික සාමාන්‍ය රුපියල් දශලක්ෂ 50 ක් වූ අතර, ඒවා මුළු තැන්පතුවලින් සියයට 2·7 ක් විය. මුලින් දක්වා ඇති පරිදි වට්ටම් කළ බිල්පත් සැලකිය යුතු අන්දමින් අඩුවීමට හේතු වූයේ, කාලයක් තිස්සේ වෙළඳ බැංකුවල එකතුවෙමින් පැවති රජයේ ආනයන බිල්පත් තොගයක් ආපසු ගෙවීමයි.

මෙලෙස අවසාන තෙමස තුළ ප්‍රමාණයටත් වඩා ඉහළ ද්‍රවශීලතා තත්ත්වයක් වෙළඳ බැංකු සතු වුවද, මුල් මාස නමය තුළ එහි සැළකිය යුතු මිරිකීමක් තිබුණ බව පෙනේ. 1969 සියයට 66·6 හා සසඳන කල, 1970 මුල් මාස නමය තුළදී මුළු

තැන්පතු සඳහා වූ ණය හා අයිරාවන්හි සාමාන්‍ය මාසික මට්ටම සියයට 71·4 ක් විය. 1970 මුල් මාස නවයේදී වෙළඳ බැංකුවල ආයෝජන ශීර්ෂය මුළු තැන්පතු සඳහා වූ සාමාන්‍ය මාසික අනුපාතිකයක් ලෙස ගත්විට සියයට 13·5 ක් විය. 1969 දී එම ප්‍රමාණය සියයට 14·8 ක් විය. අවසාන තෙමසෙහි ඒවායේ ද්‍රවශීල තත්ත්වයේ වර්ධනයත් සමග දෙසැම්බර් අවසානයේ දී මෙම අනුපාතය සියයට 15·1 දක්වා වැඩිවිය 1970 දෙසැම්බර් අවසානයේදී මුළු තැන්පතු සඳහා වූ ණය සහ අයිරා අනුපාතය සියයට 58·6 දක්වා පහත වැටුණි.

### 4. අරමුදල්වල මූලයන් සහ ඒවායේ උපයෝගීකරණය.

ඉකුත් වසර හා සසඳන කල, 1970 දී වෙළඳ බැංකු සමග පුද්ගලික අංශය කළ ගනුදෙනු තුලින්, රාජ්‍ය අංශයෙහි ප්‍රයෝජනය සඳහා සැළකිය යුතු සම්පත් ප්‍රමාණයක් ලැබුණි. වෙළඳ බැංකු සම්පත් සඳහා වූ රජයේ ඉල්ලුම ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේදී සෑහෙන ප්‍රමාණයකින් වැඩිවූ බව දැකිය හැක. මෙම වැඩිවූ ඉල්ලුම, සපුරාලීමට වෙළඳ බැංකු සමත් වූයේ පෞද්ගලික අංශය වෙතින් ලත් සම්පත් හේතුවෙනි. වෙළඳ බැංකුවලට මහ බැංකුවෙන් ගන්නා ණය ප්‍රමාණයද සැලකිය යුතු ප්‍රමාණයකින් මෙම වර්ෂයේදී අඩුකර ගැනීමට හැකිවිය.

පෞද්ගලික අංශය තුළ, බැංකු ධන සම්පත්වලින් සමුපකාර ආයතනයන් ප්‍රයෝජනයට ගත් ප්‍රමාණය සැලකිය යුතු අන්දමින් වැඩිවූ නමුත්, බැංකු සම්පත් වර්ධනයෙහිලා ඒවා දයක වූයේ සුළු වශයෙනි. සමූපකාර ආයතනයන් වෙනට ගලාගිය සම්පත් වැඩිවූ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 146·3 ක් වූ අතර, ඒවා සම්පූර්ණයෙන්ම පාහෙ අත්තිකාරම් වලින් යුක්තවිය. තැන්පතු වැඩිවීමක ස්වභාවයෙන් බැංකු සම්පත් වැඩිකරලීමෙහිලා එම ආයතනයන්හි දයකත්වයේ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 19·0 ක් විය. බැංකු සම්පත්වලින්, රාජ්‍ය සංස්ථාවන් මගින් උපයෝගීකොට ගත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 43·1 ක් විය. ඒවා අත්තිකාරම් වශයෙන් ගන්නා ලදී. එහෙත් මෙම සංස්ථාවන් මගින් තැන්පතු ආකාරයෙන් බැංකු සම්පත්හි ඇතිකළ වැඩිකිරීම් රුපියල් දශලක්ෂ 44·7 ක් වූයේ, උපයෝගී කොට ගත්ප්‍රමාණයට වඩා මඳක් වැඩිවිය. පෞද්ගලික අංශයේ සෙසු ගනුදෙනු කරුවන් බැංකු වෙත සැපයූ සම්පත්හි වැඩිවීම රුපියල් දශලක්ෂ 363·4 ක් වූ අතර, එය සමන්විත වූයේ රුපියල් දශලක්ෂ 341·9 ක තැන්පතු වැඩිවීමකින් හා රුපියල් දශලක්ෂ 21·5 ක අත්තිකාරම් හා ආයෝජනයන්හි අඩුවීමකිනි.

වෙළඳ බැංකුවල වැඩිවූ සම්පත් ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 335·6 ක් රාජ්‍ය අංශය මගින් ප්‍රයෝජනයට ගන්නා ලදී. එය සම්පූර්ණයෙන්ම පාහේ වෙළඳ බැංකුවල, රාජ්‍ය පත් දැරීම් වැඩිවීමක ස්වරූපයෙන් විය. එම වැඩිවීම රුපියල් දශලක්ෂ 335·0 කි. ඉකුත් වර්ෂයේදී, ඒවා රුපියල් දශලක්ෂ 83·0 කින් අඩුවී තිබුණි. වෙළඳ බැංකු සම්පත් වර්ධනයෙහිලා රාජ්‍ය අංශය මගින් දයකවූ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 215·5 ක් විය. රුපියල් දශලක්ෂ 73·7 ක තැන්පතු වැඩිවීමකින් සහ, රුපියල් දශලක්ෂ 141·8 ක ආනයන බිල්පත් අඩු වීමකින් එය සැකසිනි. මේ අනුව, වෙළඳ බැංකු වෙතින් රාජ්‍ය අංශයට ඇදී ගිය ශුද්ධ සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 120·1 ක් විය.

1970 වර්ෂයේදී. විදේශීය අංශයෙන් වෙළඳ බැංකුවලට අත්වූ සම්පත් ප්‍රමාණයෙහි ශුද්ධ වැඩිවීම රුපියල් දශලක්ෂ 1·2 ක් වූයේය. 1969 වර්ෂයේදී එහි, රුපියල් දශලක්ෂ 26·6 ක ශුද්ධ වැඩිවීමක් තිබුණි. දේශීය වෙළඳ බැංකු ක්‍රමය තුළින් රැස්වූ සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 77·6 ක් වූ අතර, බැංකු ක්‍රමය තුළ ප්‍රයෝජනයට ගත් සම්පත් ප්‍රමාණය, රැස්වූ සම්පත් ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 34·7 කින් ඉක්මවිය. මෙකී ප්‍රයෝජනයට ගැනීම සිදුවූයේ ප්‍රධාන වශයෙන්ම, ස්ථාවර හා අනෙකුත් වත්කම්හි වැඩිවීමක ස්වභාවයෙනි.

සංචිත වැඩිවීමක ස්වභාවයෙන් මහ බැංකුව වෙත තබාගත් වෙළඳ බැංකු සම්පත් වැඩිවූ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 88·3 ක් වූ අතර, මහ බැංකුවෙන් ලබාගත් සම්පත් රුපියල් දශ ලක්ෂ 4·3 කින් වැඩිවිය. ඉකුත් වර්ෂයේදී පැවැති තත්වය මීට වෙනස් වූයේ, වෙළඳ බැංකු මගින් මහ බැංකුවෙන් ලබාගත් සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 89·3 ක් විය. ණය ගැනීම් රුපියල් දශලක්ෂ 84·3 ක වැඩිවීමකින් සහ සංචිත රුපියල් දශලක්ෂ 5·0 ක අඩුවීමකින් මෙය සැකසී තිබුණි.

## II (ඇ) 9 සංඛ්‍යා සටහන

## 1967 - 1970 කාලය තුළදී බැංකු සම්පත්වල වාර්ෂික වෙනස්වීම් සහ ඒවා ප්‍රයෝජනයට ගත් ආකාරය

රුපියල් දශ ලක්ෂ

| | 1967 | 1968 | 1969 | 1970 |
|---|---|---|---|---|
| **අරමුදල් ලබාගත් මාර්ගයන්** | | | | |
| 1· රාජ්‍ය අංශය .. .. | 64·3 | 150·9 | 83·0 | 215·5 |
| රාජ්‍ය පත්‍රිකා දැරීම්හි අඩුවීම .. | 64·3 | — | 83·0 | — |
| තැන්පතු වැඩිවීම .. .. .. | — | 25·9 | — | 73·7 |
| ආනයන බිල්පත් අඩුවීම .. .. | — | 125·0 | — | 141·8 |
| කෙටිකාලීන ණය අඩුවීම (අ) .. .. | — | — | — | — |
| 2· මහ බැංකුව .. .. | 59·3 | 2·3 | 89·3 | 4·3 |
| ණය ගැනීම් වැඩිවීම .. .. | 59·3 | — | 84·3 | 4·3 |
| සංචිත අඩුවීම .. .. | — | 2·3 | 5·0 | — |
| 3· රජයේ සමායතන .. . | 93·5 | — | — | 44·7 |
| තැන්පතු වැඩිවීම .. .. | 93·5 | — | — | 44·7 |
| අත්තිකාරම් අඩුවීම .. .. | — | — | — | — |
| 4· සමුපකාර ආයතන .. .. | 9·9 | 0·6 | — | 19·0 |
| තැන්පතු වැඩිවීම .. .. | 9·9 | 0·6 | — | 19·0 |
| අත්තිකාරම් අඩුවීම .. .. | — | — | — | — |
| 5· අනිකුත් දේශීය පෞද්ගලික අංශය .. | 50·0 | 167·1 | 132·9 | 363·4 |
| තැන්පතු වැඩිවීම (ආ) .. .. | 50·0 | 167·1 | 132·9 | 341·9 |
| අත්තිකාරම් සහ ආයෝජන අඩුවීම .. | — | — | — | 21·5 |
| 6· අන්තර්-බැංකු (ආ) .. .. | 108·3 | 62·5 | 35·8 | 77·6 |
| ප්‍රාග්ධනය හා සංචිත වැඩිවීම .. .. | 7·3 | 6·1 | 14·5 | 17·8 |
| ස්ථාවර හා අනිකුත් වත්කම් අඩුවීම .. | — | — | 0·1 | — |
| ''අනිකුත්'' වගකීම් වැඩිවීම .. .. | 81·3 | 52·4 | 21·2 | 57·9 |
| අන්තර්-බැංකු ගනුදෙනු (ශුද්ධ) .. .. | — | 4·0 | — | 1·9 |
| කැට මුදල් අඩුවීම .. .. | 19·7 | — | — | — |
| 7· විදේශීය අංශය .. .. .. | 1·0 | 7·3 | 27·6 | 9·1 |
| ණය ගැනීම් වැඩිවීම .. .. | — | 7·1 | 3·0 | — |
| තැන්පතු වැඩිවීම .. .. | 1·0 | 0·2 | — | 0·7 |
| විදේශීය ශේෂ අඩුවීම .. .. | — | — | 24·6 | 8·4 |
| සම්පත්වල මුළු වැඩිවීම .. .. | 386·3 | 390·7 | 368·6 | 733·6 |
| **අරමුදල් ප්‍රයෝජනයට ගත් ආකාරය** | | | | |
| 1· රාජ්‍ය අංශය .. .. .. | 157·7 | 10·1 | 100·4 | 335·6 |
| රාජ්‍ය පත්‍රිකා දැරීම්හි වැඩිවීම .. .. | — | 10·1 | — | 335·0 |
| තැන්පතු අඩුවීම .. .. .. | 18·2 | — | 4·3 | — |
| රජයේ ආනයන බිල්පත් වැඩිවීම .. .. | 139·5 | — | 87·9 | — |
| කෙටිකාලීන ණය වැඩිවීම (අ) .. .. | — | — | 8·2 | 0·6 |
| 2· මහ බැංකුව .. .. .. | 55·9 | 14·8 | — | 88·3 |
| ණය ගැනීම් අඩුවීම .. .. | — | 14·8 | — | — |
| සංචිත වැඩිවීම .. .. .. | 55·9 | — | — | 88·3 |
| 3· රජයේ සමායතන .. .. | 11·4 | 115·5 | 85·4 | 43·1 |
| තැන්පතු අඩුවීම .. .. | — | 24·9 | 15·5 | — |
| අත්තිකාරම් වැඩිවීම .. .. | 11·4 | 90·6 | 69·9 | 43·1 |
| 4· සමුපකාර ආයතන .. .. | 7·3 | 18·5 | 23·8 | 146·3 |
| තැන්පතු අඩුවීම .. .. | — | — | 3·9 | — |
| අත්තිකාරම් වැඩිවීම .. .. | 7·3 | 18·5 | 19·9 | 146·3 |
| 5· අනිකුත් දේශීය පෞද්ගලික අංශය .. | 87·9 | 181·8 | 142·1 | — |
| තැන්පතු අඩුවීම .. .. | — | — | — | — |
| අත්තිකාරම් සහ ආයෝජන වැඩිවීම .. | 87·9 | 181·8 | 142·1 | — |
| 6· අන්තර් බැංකු (ආ) .. .. | 58·7 | 39·4 | 15·7 | 112·3 |
| ප්‍රාග්ධනය හා සංචිත අඩුවීම .. .. | — | — | — | — |
| ස්ථාවර හා අනිකුත් වත්කම් වැඩිවීම .. | 57·7 | 17·6 | — | 88·1 |
| ''අනිකුත්'' වගකීම් අඩුවීම .. .. | — | — | — | — |
| අන්තර්-බැංකු ගනුදෙනු (ශුද්ධ) .. .. | 1·0 | — | 0·8 | — |
| කැට මුදල් වැඩිවීම .. .. | — | 21·8 | 14·9 | 24·2 |
| 7· විදේශ අංශය .. .. .. | 7·3 | 10·6 | 1·0 | 7·9 |
| ණය ගැනීම් අඩුවීම .. .. | 0·9 | — | — | 7·9 |
| තැන්පතු අඩුවීම .. .. .. | — | — | 1·0 | — |
| විදේශීය ශේෂ වැඩිවීම .. .. | 6·4 | 10·6 | — | — |
| ප්‍රයෝජනයට ගත් සම්පත්වල මුළු වැඩිවීම .. | 386·2 | 390·7 | 368·4 | 733·5 |

මූලය. ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) මෙම ශීර්ෂය, රජයේ ගිණුම මත මිළදී ගත් චෙක්පත්, මුදල් ඇනවුම් හා සම්බන්ධිතය.

(ආ) වෙළඳ බැංකු ක්‍රමය තුළ සිදුවන ගනුදෙනු හේතු කොට ගෙන වත්කම්/වගකීම්හි ඇතිවන වෙනස්වීම් සියල්ලක්ම මෙහි ඇතුළත්ය. පෞද්ගලික අංශය සමග ඇති, බැංකුවල ''අනිකුත්'' වගකීම්හි වෙනස්වීම් හේතුකොට ගෙන සිදුවන ගනුදෙනු සමහරක් මෙහි සඳහන් කරන්නේ, සමායතන, සමූපාකාර ආයතන සහ පෞද්ගලික අංශයේ අනිකුත් කොටස්වලට මෙම ශීර්ෂයෙහි වෙනස්වීම් ඇතුළත් කිරීමට ඇති දුෂ්කරතාව නිසාය.

මෙම කාලයේදී රජය සහ සමුපකාර යන අංශයන් කෙරෙන් හටගත් ඉල්ලුම් පෞද්ගලික අංශයේ අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් අත් වූ සම්පත්වලින් සපුරාලීමට වෙළඳ බැංකු සමත් වීම, වර්ෂය සමස්ත වශයෙන් ගත් විට පැහැදිලි වන සමාන්‍ය තත්ත්වයයි. දෙවෙනුව දක්වූ සම්පත් ප්‍රමාණවත්වූ අතර, මහ බැංකුවෙන් ණය ගැනීමට බැංකුවලට අවශ්‍යවූයේ සුළු වශයෙනි. ඉකුත් වර්ෂයේදී, බැංකු සම්පත් වැඩිකර ගැනීම පිණිස මහ බැංකුවෙන් විශාල වශයෙන් ණය ගැනීමට ඒවාට සිදු විය. වර්ෂයේ මුල් භාගයේදී පැවැති තත්ත්වය මෙයට වෙනස් වූවකි. එම කාලයේදී සමුපකාරයන් සහ රජයේ සමායතනයන් මගින් ප්‍රයෝජනයට ගත් සම්පත්වල ඇති වූ වැඩිවීමෙන් විශාල කොටසක් සපයන ලද්දේ මහ බැංකුව සහ 'සෙසු දේශීය පෞද්ගලික අංශය' මගිනි.

## 5. පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය

පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වූයේ, එකතුවෙමින් පැවති මුදල් ශීර්ෂයන්හිවූ රුපියල් දශලක්ෂ 137·6 ක සීඝ්‍ර වැඩිවීමයි. ඉකුත් වර්ෂයේදී මෙම ශීර්ෂයෙහි රුපියල් දශලක්ෂ 18·7 ක අඩුවීමක් දක්නට තිබිණි. සහතික මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීම සඳහා දෙනු ලැබූ බඩු තොග කුවිතාන්සි අත්තිකාරම්හිවූ රුපියල් දශලක්ෂ 144·3 ක වැඩිවීමක් පෞද්ගලික අංශය තුළ මෙවර ඇතිවූ අත්තිකාරම් වැඩිවීම කෙරෙහි හේතු විය.

වෙළඳ බැංකු මගින් දෙන ලද ලෝන රුපියල් දශලක්ෂ 77·2 කින් ඉහළ ගියේය. එයින් රුපියල් දශලක්ෂ 71·3 ක ප්‍රමාණයක් මැදි හා දිගු කාලීන ණය ප්‍රමාණයන් විය. අනෙක් අතට, අයිරාවන් රුපියල් දශලක්ෂ 36.6 කින් පහළ වැටිණි. අපනයන බිල්පත් රුපියල් දශලක්ෂ 20·6 කින් වැඩිවූ අතර, ආනයන බිල්පත්හි රුපියල් දශලක්ෂ 31·0 පහළ වැටීමක් දක්නට තිබිණි.

### II (ඇ) 10 සංඛ්‍යා සටහන

### පෞද්ගලික අංශයට* දෙන ලද වෙළඳ බැංකු අත්තිකාරම්

### 1969 දෙසැම්බර් — 1970 දෙසැම්බර්

රුපියල් දශලක්ෂ

| | ලාංකික බැංකු | | | විදේශීය බැංකු | | | සියළුම බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1969 දෙසැම්බර් | 1970 දෙසැම්බර් | වෙනස | 1969 දෙසැම්බර් | 1970 දෙසැම්බර් | වෙනස | 1969 දෙසැම්බර් | 1970 දෙසැම්බර් | වෙනස |
| (අ) එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂ** .. | 33·1 | 171·2 | +138·1 | 0·8 | 0·2 | — 0·6 | 33·8 | 171·4 | +137·6 |
| (ආ) දේශීය බිල්පත් .. | — | — | — | — | — | — | — | — | — |
| (ඇ) ආනයන බිල්පත් .. | 35·0 | 16·1 | — 18·9 | 32·9 | 20·8 | – 12·1 | 67·9 | 36·9 | — 31·0 |
| (ඈ) අපනයන බිල්පත් .. | 25·0 | 32·1 | + 7·1 | 60·8 | 74·4 | + 13·6 | 85·9 | 106·5 | + 20·6 |
| (ඉ) අයිරාවන් .. | 379·1 | 342·9 | — 36·2 | 246·2 | 245·8 | — 0·4 | 625·3 | 588·7 | — 36·6 |
| (ඊ) ණය .. | 637·9 | 731·4 | + 93·5 | 99·2 | 82·8 | — 16·4 | 737·0 | 814·2 | + 77·2 |
| එකතුව | 1110·1 | 1293·7 | +183·6 | 439·9 | 424·0 | — 15·9 | 1549·9 | 1717·7 | +167·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* රජයේ සමායතනයන්ද ඇතුළත්ය.

** අය ලබා ගැනීම සඳහා යැවුනු චෙක්පත්, මුදල් ඇනවුම් ආදියත්, සහතික මිල ක්‍රමය යටතේ ආහාර ද්‍රව්‍යයන් මිළට ගැනීම සඳහා බැංකු මගින් සමුපකාර ආයතනයන්ට දෙනු ලැබූ කෙටිකාලීන අත්තිකාරම්ද මෙම ගණයෙහි අඩංගුව ඇත.

වෙළඳ බැංකුවල අත්තිකාරම් අරමුණු සහ කල්පිරීම් අනුව වර්ග කොට II (ඇ) II වැනි සංඛ්‍යා සටහනින් දැක්වෙයි. මෙම සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති සංඛ්‍යාවන්, වෙළඳ බැංකු තැන්පතු හා අත්තිකාරම් පිළිබඳ මහ බැංකුවේ සමීක්ෂණයකින් සකස් කර ගන්නා ලදී. මෙම සමීක්ෂණයට අදාළ වෙනුයේ, ලෝන හා අයිරාවන්, අපනයන බිල්පත් හා ආනයන බිල්පත් ස්වරූපයෙන් රාජ්‍ය සංස්ථාවන් ඇතුළුව පෞද්ගලික අංශයට දෙන ලද අත්තිකාරම්ය. එහෙත් එකතුවෙමින් පැවති මුදල් ශීර්ෂයන් එයට ඇතුළත් නොවේ.

කෘෂිකාර්මික අරමුණු සඳහා දෙන ලද අත්තිකාරම්, මුළු අත්තිකාරම්වල ප්‍රතිශතයක් හැටියට ගත් විට 1969 වර්ෂය අවසානයේදී, සියයට 11.7 සිට,1970 වර්ෂය අවසාන වන විට සියයට 13.1 දක්වා ඉහළ ගියේය. කාර්මික අරමුණු සඳහා දුන් අත්තිකාරම් සියයට 25·6 සිට 26.9 දක්වා වැඩි විය. එහෙත් වාණිජ සහ මූල්‍ය අරමුණු සඳහා දුන් අත්තිකාරම්, පිළිවෙලින් සියයට 44.2 සහ 9·2 සිට සියයට 41.7 සහ 8.9 දක්වා පහළ වැටිණි. පාරිභෝජන අරමුණු සඳහා දුන් අත්තිකාරම් සම්බන්ධයෙන් සුළු වෙනස් වීමක් දැකිය හැක. 1969 වර්ෂය අවසානයේදී පැවති මුළු අත්තිකාරම් සඳහා ''අනෙකුත් ණය'' කොටස් අනුපාතිකය මෙම වර්ෂයේදී නොවෙනස්ව පැවතිණි. නිරපේක්ෂ වශයෙන් ගත් විට, මුළු අත්තිකාරම් ප්‍රමාණයෙහි රුපියල් දශලක්ෂ 30.6 ක වැඩිවීමක් සමන්විත වූයේ, ප්‍රධාන වශයෙන්ම කාර්මික අත්තිකාරම් රුපියල් දශලක්ෂ 28·7 කින් හා කෘෂිකාර්මික අත්තිකාරම් රුපියල් දශලක්ෂ 26.4 කින් වැඩිවීමෙනුත් වාණිජ අරමුණු සඳහා දුන් අත්තිකාරම් රුපියල් දශලක්ෂ 24.8 කින් අඩුවීමෙනුත්ය.

කාර්මික අංශයට දුන් අත්තිකාරම්හිවූ වැඩිවීම රුපියල් දශලක්ෂ 28·7 ක් වුවද,1969 වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 155.6 ක් විය. මෙම අත්තිකාරම් 1970 වර්ෂයේ දෙවැනි කාර්තුවේදි රුපියල් දශලක්ෂ 60.8 කින් විශාල ලෙස වැඩි වුවත් අවසාන කාර්තු දෙකේදී රුපියල් දශලක්ෂ 32.1 කින් පහළ වැටිණි. මෙම වර්ෂය තුලදී වැඩිවූ රුපියල් දශලක්ෂ 28.7 න් රාජ්‍ය සංස්ථාවන් ලබා ගත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7·5 කි. රුපියල් දශලක්ෂ 21.2 ක්වූ ශේෂය ප්‍රයෝජනයට ගන්නා ලද්දේ පෞද්ගලික අංශයේ අනෙකුත් ණය ගනුවන් විසිනි. කර්මාන්ත අනුව බලන විට, විශාලතම වැඩිවීමක් දැකිය හැක්කේ ''අනෙකුත් කර්මාන්ත'' සඳහා දුන් ණය (රුපියල් දශලක්ෂ 16.9) සම්බන්ධයෙනි. අනෙකුත් වර්ගයන්හිවූ වැඩිවීම් මෙසේය. රසායනික නිෂ්පාදිත (රුපියල් දශලක්ෂ 8.0) ත්, රබර් සහ පොල් යන්ත්‍රානුසාරයෙන් සකස් කිරීම (රුපියල් දශලක්ෂ 7·0) ලෝහ භාණ්ඩ (රුපියල් දශලක්ෂ 6.8) වශයෙනි. 1969 වර්ෂයේදී, රුපියල් දශලක්ෂ 46.9 ක විශාලතම වැඩිවීමක් දැක්වූ පේෂකර්මාන්තයන්, මෙම වර්ෂයේදී රුපියල් දශලක්ෂ 8.4 ක අඩුවීමක් වාර්තා කෙළේය. අනෙකුත් වර්ගයන්හි කර්මාන්ත සඳහා දුන් අත්තිකාරම්වලවූ වෙනස්වීම් සැලකිය යුතු නොවන තරම්ය. 1970 වර්ෂයේ එක් එක් කාර්තුව සඳහාත් 1969 වර්ෂයේ අවසාන කාර්තුව අවසානයේදීත්, කාර්මික අරමුණු සඳහා දුන් අත්තිකාරම්හි නොපියවූ ශේෂයන් පිළිබඳ සවිස්තර වර්ගීකරණයක් II(ඇ) 12 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

වාණිජ අරමුණු සඳහා දුන් අත්තිකාරම් අතරින්, ආනයන වෙළඳාම සඳහා දුන් ඒවා මෙම වර්ෂය තුළදී, රුපියල් දශලක්ෂ 48·3 කින් ක්‍රමිකව අඩුවී ඇත. 1969 වර්ෂයේදී ඒවා අඩුවී තිබුණේ රුපියල් දශලක්ෂ 16·8 කිනි. අපනයන වෙළඳාම සහ, තොග හා සිල්ලර වෙළඳාම සඳහා දුන් අත්තිකාරම්ද පිළිවෙලින් රුපියල් දශලක්ෂ 2.4 කින් සහ රුපියල් දශලක්ෂ 3.2 කින් අඩු විය. 1969 වර්ෂයේදී ඒවා පිළිවෙලින් රුපියල් දශලක්ෂ 18.0 කින් සහ රුපියල් දශලක්ෂ 7·7 කින් වැඩිවී තිබිණි. අනෙකුත් වානිජ අත්තිකාරම් රුපියල් දශලක්ෂ 29·0 කින් ඉහළ ගියේය; 1969 වර්ෂයේදී ඒවායේ වැඩිවීම රුපියල් දශලක්ෂ 31·1 කි.

කෘෂිකාර්මික අරමුණු සඳහා දුන් අත්තිකාරම්හි වැඩිවූ රුපියල් දශලක්ෂ 26·4 ක ප්‍රමාණයෙන් භාගයකටත් වඩා වැඩි කොටසක් අපනයන භෝග සඳහා දෙන ලදී. එකී අත්තිකාරම්හි වැඩිවීම රුපියල් දශලක්ෂ 14·6 ක් විය. 1969 වර්ෂයේදී ඒවා වැඩිවී තිබුනේ රුපියල් දශලක්ෂ 8·5 කිනි. වී නිෂ්පාදනය සඳහා දුන් අත්තිකාරම් රුපියල් දශලක්ෂ 4·9 කින් ඉහළ ගියේය. 1969 වර්ෂයේදී එහි වැඩිවීම රුපියල් දශලක්ෂ 14·0 ක් විය. පශු සම්පත් සහ කිරි පට්ටි පාලනය ඇතුළුව අනෙකුත් කෘෂිකාර්මික භෝග සඳහා දෙන ලද අත්තිකාරම් රුපියල් දශලක්ෂ 6·9 කින් වැඩිවූයේ, ඉකුත් වර්ෂයේදී ඒවා රුපියල් දශලක්ෂ 13·8 කින් වැඩිවී තිබුනි.

## II (ඈ) 11 සංඛ්‍යා සටහන

## අරමුණු හා කල්පිරීම් අනුව වර්ග කරන ලද අත්තිකාරම්*

රුපියල් දශ ලක්ෂ

| | කෙටි – කාලීන (1) | (2) (1), (7) හි % වශයෙන් | මැදි – කාලීන (3) | (4) (3), (7) හි % වශයෙන් | දිගු – කාලීන (5) | (6) (5), (7) හි % වශයෙන් | එකතුව (7) | (8) (7), එකතු වෙහි % වශයෙන් |
|---|---|---|---|---|---|---|---|---|
| **(අ) වාණිජ** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 271·4 | 40·6 | 277·0 | 41·4 | 120·3 | 18·0 | 668·7 | 44·2 |
| 1970 මාර්තු .. | 292·1 | 44·1 | 252·2 | 38·1 | 118·4 | 17·9 | 662·6 | 43·2 |
| 1970 ජූනි .. | 277·9 | 42·8 | 255·7 | 39·4 | 115·4 | 17·8 | 648·9 | 41·5 |
| 1970 සැප්තැම්බර් .. | 517·0 | 79·9 | 90·8 | 14·0 | 39·2 | 6·1 | 647·0 | 42·0 |
| 1970 දෙසැම්බර් .. | 502·4 | 78·0 | 104·6 | 16·2 | 36·8 | 5·7 | 643·9 | 41·7 |
| **(ආ) මූල්‍ය** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 47·1 | 34·0 | 45·2 | 32·6 | 46·3 | 33·4 | 138·6 | 9·2 |
| 1970 මාර්තු .. | 52·0 | 37·6 | 42·0 | 30·4 | 44·3 | 32·0 | 138·3 | 9·0 |
| 1970 ජූනි .. | 60·2 | 41·1 | 37·5 | 25·6 | 48·6 | 33·2 | 146·4 | 9·4 |
| 1970 සැප්තැම්බර් .. | 78·4 | 53·7 | 38·2 | 26·1 | 29·5 | 20·2 | 146·0 | 9·5 |
| 1970 දෙසැම්බර් .. | 74·8 | 54·5 | 33·3 | 24·2 | 29·2 | 21·3 | 137·3 | 8·9 |
| **(ඇ) කෘෂිකාර්මික** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 25·6 | 14·5 | 105·2 | 59·6 | 45·8 | 25·9 | 176·6 | 11·7 |
| 1970 මාර්තු .. | 40·4 | 20·0 | 106·1 | 52·4 | 55·8 | 27·6 | 202·3 | 13·2 |
| 1970 ජූනි .. | 24·1 | 12·9 | 106·6 | 57·2 | 55·5 | 29·8 | 186·2 | 11·9 |
| 1970 සැප්තැම්බර් .. | 88·3 | 47·7 | 69·6 | 37·5 | 27·5 | 14·8 | 185·3 | 12·0 |
| 1970 දෙසැම්බර් .. | 91·8 | 45·2 | 85·6 | 42·2 | 25·6 | 12·6 | 203·0 | 13·1 |
| **(ඈ) කාර්මික** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 158·5 | 40·9 | 82·0 | 21·2 | 146·8 | 37·9 | 387·3 | 25·6 |
| 1970 මාර්තු .. | 147·9 | 38·1 | 82·5 | 21·3 | 157·2 | 40·5 | 387·7 | 25·3 |
| 1970 ජූනි .. | 177·1 | 39·5 | 76·1 | 17·0 | 194·8 | 43·5 | 448·1 | 28·7 |
| 1970 සැප්තැම්බර් .. | 202·7 | 48·0 | 150·7 | 35·7 | 68·8 | 16·3 | 422·2 | 27·4 |
| 1970 දෙසැම්බර් .. | 197·0 | 47·3 | 151·5 | 36·4 | 67·4 | 16·2 | 416·0 | 26·9 |
| **(ඉ) පරිභෝජනය** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 15·4 | 15·6 | 32·7 | 33·1 | 50·7 | 51·3 | 98·8 | 6·5 |
| 1970 මාර්තු .. | 16·3 | 16·9 | 30·4 | 31·5 | 49·6 | 51·3 | 96·6 | 6·3 |
| 1970 ජූනි .. | 14·7 | 16·0 | 29·6 | 32·2 | 47·5 | 51·7 | 91·9 | 5·9 |
| 1970 සැප්තැම්බර් .. | 22·1 | 22·6 | 46·4 | 47·5 | 29·2 | 29·9 | 97·7 | 6·3 |
| 1970 දෙසැම්බර් .. | 22·1 | 22·3 | 50·9 | 51·4 | 26·1 | 26·3 | 99·1 | 6·4 |
| **(ඊ) අනෙකුත් ණය** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 3·8 | 8·8 | 24·1 | 55·5 | 15·6 | 35·9 | 43·4 | 2·9 |
| 1970 මාර්තු .. | 11·9 | 25·6 | 18·1 | 38·9 | 16·4 | 35·3 | 46·5 | 3·0 |
| 1970 ජූනි .. | 10·6 | 25·1 | 15·1 | 35·7 | 16·5 | 39·1 | 42·2 | 2·7 |
| 1970 සැප්තැම්බර් .. | 21·2 | 48·3 | 17·9 | 40·8 | 4·8 | 10·9 | 43·8 | 2·8 |
| 1970 දෙසැම්බර් .. | 21·4 | 47·7 | 18·2 | 40·5 | 5·3 | 11·8 | 44·9 | 2·9 |
| **(උ) එකතුව** | | | | | | | | |
| 1969 දෙසැම්බර් .. | 521·7 | 34·5 | 566·2 | 37·4 | 425·5 | 28·1 | 1513·5 | 100·0 |
| 1970 මාර්තු .. | 560·8 | 36·6 | 531·3 | 34·6 | 441·8 | 28·8 | 1534·1 | 100·0 |
| 1970 ජූනි .. | 564·7 | 36·1 | 520·6 | 33·3 | 478·4 | 30·6 | 1563·7 | 100·0 |
| 1970 සැප්තැම්බර් .. | 929·6 | 60·3 | 413·5 | 26·8 | 199·0 | 12·9 | 1542·1 | 100·0 |
| 1970 දෙසැම්බර් .. | 909·6 | 58·9 | 444·0 | 28·7 | 190·5 | 12·3 | 1544·1 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* අත්තිකාරම් හි ලෝණ, අයිරාවන් සහ වට්ටම් කරන ලද බිල්පත් ඇතුළත් වේ. එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ එයට ඇතුළත් නොවේ.

සටහන: 1970 සැප්තැම්බර් මාසය අවසානයේ සිට, කෙටි, මැදි හා දිගුකාලීන යනුවෙන් දක්වූ කාලසීමාවන් හැඳින්වීම, පිළිවෙලින් ''මාස 6 ට අඩු'' යන්න ''මාස 12 ට අඩු'' වශයෙන්ද, ''මාස 6 සිට මාස 30 දක්වා'' යන්න ''මාස 12 ට වැඩි සහ අවුරුදු 5 දක්වා'' වශයෙන්ද, ''මාස 30 ට වැඩි'' යන්න ''වර්ෂ 5 ට වැඩි'' වශයෙන්ද වෙනස්කරන ලදී.

## II (ඈ) 12 සංඛ්‍යා සටහන

## කාර්මික අරමුණු සඳහා වෙළඳ බැංකු අත්තිකාරම්

රුපියල් දශලක්ෂ

| අරමුණ | කාලය අවසානයේදී පැවැති නොපියවන ලද ශේෂයන් | | | | |
|---|---|---|---|---|---|
| | 1969 දෙසැම්බර් | 1970 මාර්තු | 1970 ජූනි | 1970 සැප්තැම්බර් | 1970 දෙසැම්බර් |
| 1. රෙදිපිළි .. | 95·2 | 93·7 | 115·1 | 98·1 | 86·8 |
| රජයේ සමායතන .. | 35·7 | 26·3 | 44·0 | 29·8 | 21·2 |
| අනෙකුත් .. | 59·5 | 67·5 | 71·1 | 68·3 | 65·6 |
| 2. ලෝහ නිෂ්පාදිත .. | 35·7 | 35·6 | 39·1 | 43·0 | 42·5 |
| රජයේ සමායතන .. | 13·3 | 12·7 | 12·7 | 14·6 | 14·7 |
| අනෙකුත් .. | 22·5 | 23·0 | 26·5 | 28·4 | 27·8 |
| 3. රසායන ද්‍රව්‍ය .. | 50·0 | 51·9 | 61·5 | 58·5 | 58·0 |
| රජයේ සමායතන .. | 30·3 | 30·0 | 39·9 | 39·2 | 38·6 |
| අනෙකුත් .. | 19·7 | 21·9 | 21·6 | 19·3 | 19·4 |
| 4. පාවහන් සහ සම්භාණ්ඩ .. | 6·8 | 6·4 | 6·8 | 6·2 | 6·6 |
| රජයේ සමායතන .. | 4·5 | 4·5 | 5·0 | 4·4 | 4·7 |
| අනෙකුත් .. | 2·3 | 1·9 | 1·8 | 1·8 | 1·9 |
| 5. විස්කෝතු සහ රසකැවිලි .. | 8·3 | 7·2 | 6·6 | 6·4 | 6·7 |
| රජයේ සමායතන .. | — | — | — | — | — |
| අනෙකුත් .. | 8·3 | 7·2 | 6·6 | 6·4 | 6·7 |
| 6. තේ, රබර් සහ පොල් සකස් කිරීම | 22·0 | 22·2 | 25·0 | 29·0 | 29·0 |
| රජයේ සමායතන .. | — | — | — | — | — |
| අනෙකුත් .. | 22·0 | 22·2 | 25·0 | 29·0 | 29·0 |
| 7. ඉංජිනේරු සහ ගොඩනැගිලි ව්‍යාපාර .. | 50·5 | 51·5 | 52·2 | 50·9 | 50·9 |
| රජයේ සමායතන .. | 11·8 | 10·0 | 13·7 | 10·2 | 12·1 |
| අනෙකුත් .. | 38·7 | 41·5 | 38·5 | 40·7 | 38·8 |
| 8. අනෙකුත් කර්මාන්ත .. | 118·6 | 119·1 | 141·7 | 130·1 | 135·5 |
| රජයේ සමායතන .. | 57·0 | 60·6 | 75·4 | 64·9 | 68·8 |
| අනෙකුත් .. | 61·6 | 58·5 | 66·3 | 65·2 | 66·7 |
| එකතුව .. | 387·3 | 387·7 | 448·1 | 422·2 | 416·0 |
| රජයේ සමායතන .. | 152·6 | 144·0 | 190·6 | 163·0 | 160·1 |
| අනෙකුත් .. | 234·7 | 243·7 | 257·5 | 259·2 | 255·9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මූල්‍ය අරමුණු සඳහා දුන් අත්තිකාරම් රුපියල් දශලක්ෂ 1·3 කින් අඩුවූ අතර, පාරිභෝජන අරමුණු සඳහා දෙන ලද ණය මඳ වශයෙන්, එනම් රුපියල් දශලක්ෂ 0·3 කින් ඉහළ ගියේය. ඉතිරි වර්ගයවූ "අනෙකුත් ණය" සම්බන්ධයෙන් රුපියල් දශලක්ෂ 1·5 ක වැඩිවීමක් දක්නට තිබිණි.

1969 වර්ෂය අවසානයේදී, කෙටි කාලීන, මැදි කාලීන හා දිගු කාලීන අත්තිකාරම් මුළු වෙළඳ බැංකු අත්තිකාරම්හි ප්‍රතිශතයක් ලෙස ගත්විට ඒවා පිළිවෙලින් සියයට 34·5, සියයට 37·4, සහ සියයට 28·1 යන ප්‍රමාණයන්ගෙන් යුක්ත විය. II (ඇ) II වැනි සංඛ්‍යා සටහනෙහි අධෝ ලිපියෙන් මෙම ශීර්ෂයන් නිර්වචනය කර ඇති පරිදි මේවා ගණනය කිරීමේදී මැදි කාලීන හා දිගු කාලීන අත්තිකාරම් සමානුපාතයන් පිළිවෙලින්, සියයට 28·7 සහ සියයට 12·3 දක්වා අඩුවී තිබුණි. එහෙත් කෙටි කාලීන අත්තිකාරම් සමානුපාතය සියයට 58·9 දක්වා ඉහළ ගියේය.

1970 වර්ෂය අවසානයේදී, නොපියවා තිබූ දිගු කාලීන අත්තිකාරම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 190·5 ක් විය. එයින් සියයට 35·4 ක විශාල ප්‍රමාණයක් ලබා ගත්තේ කාර්මික අංශය මගිනි. අනෙකුත් වර්ගයන් ලබාගත් ප්‍රමාණයන් මෙසේය. වාණිජ (සියයට 19·3) මූල්‍ය (සියයට 15·3) පාරිභෝගික (සියයට 13·7) කෘෂිකාර්මික (සියයට 13·4)'අනෙකුත් ණය' (සියයට 2·7) වශයෙනි.

පොළී අනුපාතිකයන් අනුව වර්ග කරනු ලැබූ අත්තිකාරම් II (ඇ) 13 වැනි සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

### II (ඇ) 13 සංඛ්‍යා සටහන

### පොළී අනුපාතිකය අනුව අත්තිකාරම්*

| පොළී අනුපාතිකය (සියයට) | 1969 දෙසැම්බර් 31 වැනි දින | | 1970 මාර්තු 31 වැනි දින | | 1970 ජුනි 30 වැනි දින | | 1970 සැප්තැම්බර් 30 වැනි දින | | 1970 දෙසැම්බර් 31 වැනි දින | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතුවෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතුවෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතුවෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතුවෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතුවෙහි % ගණන |
| 4½ ට අඩු | 21·4 | 1·5 | 22·8 | 1·5 | 16·9 | 1·1 | 8·6 | 0·6 | 11·7 | 0·8 |
| 5 | 22·0 | 1·5 | 26·2 | 1·8 | 26·9 | 1·8 | 20·7 | 1·5 | 26·8 | 1·9 |
| 5½ | 21·0 | 1·5 | 3·1 | 0·2 | 3·6 | 0·2 | 3·2 | 0·2 | 3·1 | 0·2 |
| 6 | 211·7 | 14·8 | 87·6 | 6·0 | 85·3 | 5·8 | 48·9 | 3·4 | 51·0 | 3·5 |
| 6½ | 132·0 | 9·3 | 47·1 | 3·2 | 49·6 | 3·4 | 52·2 | 3·7 | 46·4 | 3·2 |
| 7 | 108·0 | 7·6 | 176·1 | 12·0 | 194·2 | 13·2 | 224·8 | 15·8 | 231·2 | 16·1 |
| 7½ | 302·9 | 21·2 | 160·7 | 11·0 | 159·6 | 10·9 | 149·0 | 10·5 | 140·4 | 9·8 |
| 8 | 316·5 | 22·2 | 184·0 | 12·6 | 163·7 | 11·1 | 173·4 | 12·2 | 166·9 | 11·6 |
| 8½ | 62·1 | 4·4 | 229·9 | 15·7 | 255·4 | 17·4 | 232·8 | 16·4 | 254·7 | 17·7 |
| 9 | 142·5 | 10·0 | 319·5 | 21·8 | 312·2 | 21·2 | 289·2 | 20·4 | 274·9 | 19·1 |
| 9½ | 11·0 | 0·8 | 46·0 | 3·1 | 50·5 | 3·4 | 53·3 | 3·8 | 52·0 | 3·6 |
| 10 | 26·6 | 1·9 | 64·5 | 4·4 | 72·0 | 4·9 | 77·9 | 5·5 | 85·6 | 5·9 |
| 10½ | 22·1 | 1·5 | 12·5 | 0·8 | 10·9 | 0·7 | 10·7 | 0·7 | 7·8 | 0·5 |
| 11 | 25·6 | 1·8 | 38·4 | 2·6 | 36·4 | 2·5 | 36·3 | 2·6 | 37·1 | 2·6 |
| 11½ | ... | ... | 0·7 | ... | 1·6 | 0·1 | 0·5 | ... | 6·5 | 0·5 |
| 12% හා ඊට වැඩි | 1·4 | 0·1 | 45·2 | 3·1 | 30·8 | 2·1 | 38·7 | 2·7 | 42·7 | 3·0 |
| එකතුව | 1,426·7 | 100·0 | 1,464·3 | 100·0 | 1,469·6 | 100·0 | 1,420·2 | 100·0 | 1,438·9 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* පවත්නා විනිමය අනුපාතිකයන් අනුව මිළට ගත් බිල්පත් හා එකතුකෙරිගෙන යන මුදල් ශීර්ෂ අයත් නොවේ.

වර්ෂය ආරම්භයේදී, මහ බැංකු පොළී අනුපාතිකය වැඩි කිරීමත් සමග, ඉහළ පොළී අනුපාතිකයන් යටතේ දෙන ලද අත්තිකාරම් ප්‍රමාණයෙහිද සැලකිය යුතු වැඩිවීමක් දක්නට තිබුණි. සියයට 8½ සහ ඊට වැඩි පොළී අනුපාතයක් මත දෙන ලද අත්තිකාරම් ප්‍රමාණය, 1969 වර්ෂය අවසානයේදී මුළු අත්තිකාරම් වලින් සියයට 20·5 ක් විය. එය 1970 අවසානයේදී සියයට 52·9 දක්වා ඉහළ ගියේය. වැඩිම අත්තිකාරම් ප්‍රමාණයක් දී තිබුනේ සියයට 9 පොළී අනුපාතයකටය. ඉකුත් වර්ෂයේදී සියයට 8 පොළී ප්‍රමාණය යටතේ වැඩිම අත්තිකාරම් ප්‍රමාණයක් දී තිබුණි.

ඇප වර්ග අනුව අත්තිකාරම් වර්ග කොට II (ඇ) 14 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

ලේඛන බිල්පත්, භාර කුවිතාන්සි සහ වෙළඳ තොග ඇප වශයෙන් ගෙන දෙන ලද අත්තිකාරම් අඩුවීමක් මෙම වර්ෂයේදී දක්නට තිබුණි. ඊට හේතුව වර්ෂය තුළදී දැඩි ආනයන සීමාවන් පනවා තිබීම යයි කිවහැක. රජයේ සුරැකුම් පත් සහ බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් ඇපයට ගෙන දෙන ලද අත්තිකාරම් මඳ වශයෙන් වැඩිවූ අතර කාලීන හා ඉතුරුම් තැන්පතු සහ අනෙකුත් මුදල් තැන්පතු ඇපයට ගෙන දුන් අත්තිකාරම්හි සැලකිය යුතු පහළ වැටීමක් දක්නට විය. එහෙත් නිශ්චල දේපල, ට්‍රැක්ටර් සහ මෝටර් වාහන, පොරොන්දු නෝට්ටු, පිළිනපත් සහ භාවිතීය නෝට්ටු ඇපයට ගනිමින් දෙන ලද අත්තිකාරම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

## II (ඇ) 14 සංඛ්‍යා සටහන

### අත්තිකාරම්* ඇපවර්ග අනුව

| ඇප වර්ගය | 1969 දෙසැම්බර් 31 වැනි දින | | 1970 මාර්තු 31 වැනි දින | | 1970 ජූනි 30 වැනි දින | | 1970 සැප්තැම්: 30 වැනි දින | | 1970 දෙසැම්බර් 31 වැනි දින | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතු වෙහි % ගණන |
| ලේඛනගත බිල්පත් .. | 147·0 | 9·7 | 143·2 | 9·3 | 148·8 | 9·5 | 163·3 | 10·6 | 136·1 | 8·8 |
| රජයේ සුරැකුම්පත් .. | 18·0 | 1·2 | 17·9 | 1·2 | 19·4 | 1·2 | 15·3 | 1·0 | 22·9 | 1·5 |
| බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් .. | 19·8 | 1·3 | 23·2 | 1·5 | 24·9 | 1·6 | 24·7 | 1·6 | 24·5 | 1·6 |
| කාලීන හා ඉතුරුම් තැන්පතු හා අනෙකුත් මුදල් තැන්පතු (ජීවිත රක්ෂණ ඔප්පුවල මුදල් වටිනාකම ඇතුළුව) .. | 73·6 | 4·9 | 50·7 | 3·3 | 47·8 | 3·1 | 47·0 | 3·0 | 50·1 | 3·2 |
| වෙළෙඳ තොග .. | 315·2 | 20·8 | 315·4 | 20·6 | 308·9 | 19·7 | 288·4 | 18·7 | 289·0 | 18·7 |
| නිශ්චල දේපොළ .. | 167·9 | 11·1 | 177·0 | 11·5 | 186·5 | 11·9 | 187·3 | 12·1 | 196·1 | 12·7 |
| ඇප .. | 283·9 | 18·8 | 290·3 | 18·9 | 303·0 | 19·4 | 281·4 | 18·2 | 293·9 | 19·0 |
| භාරකුච්තාන්සි .. | 139·2 | 9·2 | 104·9 | 6·8 | 129·0 | 8·2 | 94·2 | 6·1 | 118·6 | 7·7 |
| කුලී පිට ගැනුම් ගිවිසුම්.. | 32·4 | 2·1 | 30·8 | 2·0 | 28·9 | 1·8 | 28·3 | 1·8 | 22·3 | 1·4 |
| යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ .. | 6·6 | 0·4 | 7·6 | 0·5 | 8·1 | 0·5 | 9·3 | 0·6 | 9·0 | 0·6 |
| ට්‍රැක්ටර් හා මෝටර්රථ· | 33·1 | 2·2 | 39·0 | 2·5 | 37·9 | 2·4 | 60·3 | 3·9 | 59·7 | 3·9 |
| පොරොන්දු නෝට්ටු, පිළිනපත් සහ භාවිතීය නෝට්ටු .. | 169·3 | 11·2 | 210·5 | 13·7 | 216·3 | 13·8 | 232·5 | 15·1 | 206·1 | 13·3 |
| අනෙකුත් ඇප .. | 54·0 | 3·6 | 61·9 | 4·0 | 44·1 | 2·8 | 53·1 | 3·5 | 52·2 | 3·4 |
| ඇප රහිත .. | 53·4 | 3·5 | 61·4 | 4·0 | 60·0 | 3·8 | 56·5 | 3·7 | 63·5 | 4·1 |
| එකතුව .. | 1,513·5 | 100·0 | 1,534·1 | 100·0 | 1,563·7 | 100·0 | 1,542·1 | 100·0 | 1,544·1 | 100·0 |

* එකතුකෙරිගෙන යන මුදල් ශීර්ෂ අයත් නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

### (ඇ) ඉතිරි කිරීමේ සහ දිගු කාලීන ණය දෙන ආයතන

රජයේ ඉතිරි කිරීමේ සහ ණය දෙන ආයතනයන්හි ණය දීමේ කටයුතු පිළිබඳ සංඛ්‍යාවන් II (ඇ) 15 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

මෙම ආයතනයන් මගින් දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 62·4 කි. එහි ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 13·4 ක වැඩිවීමක් දැකිය හැක. සංවර්ධන මූල්‍ය සමායතනය මගින් දෙන ලද ණය ප්‍රමාණයෙහිවූ වැඩිවීම, මුළු ප්‍රමාණයෙහි වැඩිවීමෙන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයකින් යුක්ත විය. ඉකුත් වර්ෂයට වෙනස්ව යමින් මෙම වර්ෂයේදී ජාතික නිවාස දෙපර්තමේන්තුව මගින් සපයනු ලැබූ ණය ප්‍රමාණයෙහිද රුපියල් දශලක්ෂ 3·4 ක වැඩිවීමක් දක්නට තිබිණි. ලංකා ඉතිරි කිරීමේ බැංකුව, කෘෂිකාර්මික සහ කාර්මික ණය දෙන ආයතනය සහ ණය මණ්ඩලය යන ආයතන මගින් දෙන ලද ණය ප්‍රමාණයන්හිද වැඩිවීම් සටහන්වූ අතර, රජයේ උකස් බැංකුව මගින් දෙන ලද ණය ප්‍රමාණය සුළු වශයෙන් අඩු විය.

සංවර්ධන මූල්‍ය සමායතනය මගින් දෙන ලද රුපියල් දශලක්ෂ 27·1 ක මුදලෙන්, රුපියල් දශලක්ෂ 4·3 ක ණය ප්‍රමාණයක් විදේශ විනිමයෙන් දෙන ලදී. ඒවා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව හා ගිවිසගත් ණය පහසුකම්වලින් හැර ගැණිනි. ඒ අනුව ඉතිරි මුදල් ප්‍රමාණය මහ බැංකුවේ මැදි හා දිගු කාලීන ණය අරමුදලෙන් රුපියල් දශලක්ෂ 10·0 ක්ද, එහි බැංකුකරුවන්ගෙන් අයිරාවන්/ලෝන හැටියට රුපියල් දශලක්ෂ 7·9 ක්ද, තම අරමුදල් වලින් රුපියල් දශලක්ෂ 4·9 ක්ද ලබා ගනිමින්, මෙම සමායතනය මගින් මෙරට මුදලින් රුපියල් දශලක්ෂ 22·8 ක ණය පහසුකම් සපයන ලදී.

1969 සහ 1970 වර්ෂයන් තුළදී, ඉතුරුම් තැන්පතු හා ඉතුරුම් සහතිකපත්හි ඇතිවූ වෙනස්කම් සාරාංශ කොට II (ඇ) 16 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## II (ඇ) 15 සංඛ්‍යා සටහන

## දිගු කාලීන ණය දෙන ආයතනයන්හි ණය දීමේ කටයුතු

රුපියල් දහස් ගණනින්.

| | 1967 | | 1968 | | 1969 | | 1970 | |
|---|---|---|---|---|---|---|---|---|
| | දෙන ලද ණය ප්‍රමාණය | නොපියවා ඇති ණය ප්‍රමාණය | දෙන ලද ණය ප්‍රමාණය | නොපියවා ඇති ණය ප්‍රමාණය | දෙන ලද ණය ප්‍රමාණය | නොපියවා ඇති ණය ප්‍රමාණය | දෙන ලද ණය ප්‍රමාණය | නොපියවා ඇති ණය ප්‍රමාණය |
| 1. සංවර්ධන මූල්‍ය සමායතනය (අ) .. | 3150 | 29154 | 7273 | 31716 | 19561 | 47982 | 27083 | 70920 |
| 2. ලංකා ඉතිරි කිරීමේ බැංකුව .. | 3880 | 17715 | 4386 | 19943 | 3671 | 20921 | 4563 | 22803 |
| 3. කෘෂිකාර්මික සහ කාර්මික ණය දෙන සමායතනය . | 2565 | 31119 | 3285 | 30288 | 4322 | 31090 | 4719 | 31838* |
| 4. රජයේ උකස් බැංකුව .. | 4812 | 55453 | 6623 | 57816 | 8597 | 61943 | 8548* | 66987* |
| 5. ණය මණ්ඩලය .. | 1225 | 11047 | 1076 | 10758 | 1212 | 10920 | 2459 | 11858 |
| 6. ජාතික නිව ස දෙපාර්තමේන්තුව (ආ) | 25585 | 105485 | 14355 | 113960 | 11663 | 118867 | 15056 | 127386 |
| එකතුව .. | 41217 | 249973 | 36998 | 264481 | 49026 | 291723 | 62428 | 331792 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සාමාන්‍ය කොටස් ආයෝජන ඇතුලත්ය.

(ආ) සංඛ්‍යා තොරතුරු ඔක්තෝබර්/ සැප්තැම්බර් මුදල් වර්ෂයට අදළ වේ. දෙන ලද ණය සංඛ්‍යාවන් ගෙන් දැක්වෙන්නේ, පුද්ගලයින්ට සහ ගොඩනැගිලි සමිතිවලට දුන් ණය මුදල් පමණි 1967-70 සඳහා නොපියවා ඇති ණය ප්‍රමාණයන්ට ගොඩනැගිලි සමිතිවලට දෙන ලද ණය මුදල් ඇතුළත් නොවේ.

* තාවකාලිකය.

## II (ඇ) 16 සංඛ්‍යා සටහන

## ඉතුරුම් තැන්පතු සහ ඉතුරුම් සහතික පත්

රුපියල් දශලක්ෂ

| | 1968 දෙසැම්බර් | 1969 දෙසැම්බර් | 1970 දෙසැම්බර් | වෙනස 1969 / 1970 දෙසැම්බර් |
|---|---|---|---|---|
| තැපැල් කාර්යාලයිය ඉතිරිකිරීමේ බැංකුව .. | 473·3 | 490·5 | 574·2* | + 83·7 |
| ලංකා ඉතිරිකිරීමේ බැංකුව .. | 100·3 | 102·3 | 108·9(අ) | + 6·6 |
| වෙළඳ බැංකු (කාලීන හා ඉතුරුම් තැන්පතු)** .. | 826·2 | 985·6 | 1168·6 | + 183·0 |
| ඉතුරුම් සහතික පත් .. | 91·3 | 86·3 | 73·8 (අ) | − 12·5 |
| එකතුව .. | 1,491·1 | 1,664·7 | 1925·5 | + 260·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලිකයි.

* නොවැම්බර් මාසය සඳහා සංඛ්‍යාවන්ය.

** රජයේ තැන්පතු ඇතුළත් වේ.

සේවක අර්ථසාධක අරමුදලින් 1970 වර්ෂයේදී ලැබුණු මුළු දයක මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 106·8 ක් විය. ඉකුත් වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 91·9 ක්ව තිබිණි.

**(ඈ) කුලී පිට ගැනුම් මුල්‍ය සමාගම්**

ලංකාවේ, කුලී පිට ගැනුම් මූල්‍ය සමාගම්හි කටයුතු සම්බන්ධයෙන්, මහ බැංකුව මගින් සමීක්ෂණයක් කෙරෙයි. සමීක්ෂණයෙන් ලබා ගත් තොරතුරු අනුව මේවායේ මූලික කාර්යයන් පිළිබඳ සංඛ්‍යා තොරතුරු 1969 වර්ෂයේ අවසාන කාර්තු දෙක හා 1970 වර්ෂයේ මුල් කාර්තු දෙක පිළිබඳව II (ඈ) 17 වැනි සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කර ඇත. කෙසේ වුවද, සමීක්ෂණයේදී සමහර සමාගම් මගින් එවන ලද ප්‍රකාශයන්හි අඩුලුහුඩුකම් සහ ප්‍රතිවිරුද්ධතාවයන් කිහිපයක් ඇති බවද, එහෙයින් සමීක්ෂණ ප්‍රකාශයන් විශ්ලේෂණය කිරීමෙන් ලබා ගත් ප්‍රතිඵල අත්හද බැලීමක ස්වරූපයක් ගන්නා බවද මෙහිදී සැලකිය යුතු වෙයි.

**II (ඈ) 17 සංඛ්‍යා සටහන**

**කුලී පිට ගැනුම් මුල්‍ය සමාගම්හි කටයුතු**

රුපියල් දශ ලක්ෂ

| | 1969 සැප්තැම්බර් 30 | 1969 දෙසැම්බර් 31 | 1970 මාර්තු 31 | 1970 ජුනි 30 |
|---|---|---|---|---|
| 1. තැන්පතු වගකීම් .. | 43·2 | 50·1 | 54·0 | 58·8 |
| 2. නොපියවා ඇති කුලී පිට ගැනුම්හි වටිනාකම .. | 71·9 | 79·4 | 75·1 | 84·4 |
| 3. නොපියවා ඇති ණය .. | 13·1 | 16·5 | 17·9 | 19·4 |

1969 සැප්තැම්බර් සහ 1970 ජුනි අතර කාලච්ඡේදයේදී, කුලී පිට ගැනුම් මූල්‍ය සමාගම් වෙතවූ මහජනයා සතු තැන්පතු ශේෂයන් රුපියල් දශලක්ෂ 15·6 කින් හෙවත් සියයට 36·1 කින් වැඩිවිය. මහජන තැන්පතු, මුළු වගකීම්හි අනුපාතයක් වශයෙන් ගත්විට 1969 සැප්තැම්බර් අවසානයේදී සියයට 42 ක පමණ සිට 1970 ජුනි අවසානයේදී සියයට 48 ක් පමණ දක්වා වැඩිවූ බවද සමීක්ෂණයෙන් අනාවරණය වේ. සිත් ඇදගන්නා සුළු පොළී ප්‍රමාණයක් ගෙවීම හේතුවෙන් මෙම ආයතනයන්ට සැලකිය යුතු ප්‍රමාණයක තැන්පතු පරිමාවක් ලබා ගැනීමට හැකි විය; සමීක්ෂණයෙන් පෙනෙන පරිදි එක් වර්ෂයක් ඉක්මවන කාල සීමාවක් සඳහාවූ තැන්පතු වෙනුවෙන් විශාල සමාගම් මගින් වර්ෂයකට සියයට 10 සිට 12 දක්වාවූ පොළී ප්‍රමාණයක් ගෙවන අතර, කුඩා සමාගම් මගින් වර්ෂයකට ඊටත් වැඩි පොළී ප්‍රමාණයක් ගෙවන බව දැකිය හැක.

මෙම ආයතනයන්හි ණය දීමේ කටයුතුවලදී කුලී පිට ගැනුම් සඳහා දුන් ප්‍රමාණයන් ඒවායේ ව්‍යාපාර කටයුතු අතර කැපී පෙනෙයි. 1970 ජුනි අවසානයේදී ඒවායේ නොපියවා පැවති ශේෂය රුපියල් දශලක්ෂ 84·4 ක් විය. 1969 සැප්තැම්බර් අවසානයේදී රුපියල් දශලක්ෂ 71·9 ක්වූ මෙම ණය ප්‍රමාණයන් සියයට 17·4 කින් ඉහළ ගොස් තිබුණි. කුලී පිට ගැනුම් සඳහා වූ ගනුදෙනු ප්‍රමාණය මුළුමනින්ම පාහේ මෝටර් රථ සහ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් දුන් ඒවා විය; කාර්මික යන්ත්‍රෝපකරණ, කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ යනාදිය, සඳහා දුන් ණය ප්‍රමාණය, කුලී පිට ගැනුම් සඳහාවූ මුළු ණය ප්‍රමාණයෙන් සියයට එකකටත් වඩා අඩු ප්‍රමණයකි. මූල්‍ය ගාස්තු සහ අනෙකුත් අය කිරීම්ද ඇතුළුව, කුලී පිට ගැනුම් සඳහාවූ පොළී ප්‍රමාණය වර්ෂයකට සියයට 12 ත් 20 ත් අතරේ පැවතිණි. (මෙම පොළී අනුපාතිකයන් සම අනුපාතිකයන් වේ. ඇත්තෙන්ම ක්‍රියාත්මක වන අනුපාතිකයන් මීට වඩා බෙහෙවින් ඉහළය.)

ණය දෙනු ලබන්නේ සමාගම් කීපයක් මගින් පමණි. නොපියවා ඇති ණය ප්‍රමාණය 1969 සැප්තැම්බර් අවසානයේදී රුපියල් දශලක්ෂ 13·1 සිට, 1970 ජුනි අවසානය වන විට රුපියල් දශලක්ෂ 19·4 දක්වා සියයට 50 කට ආසන්න ප්‍රමණයකින් වැඩිවිය. ණය සඳහා අය කරනු ලබන පොළී අනුපාතිකයන් වර්ෂයකට සියයට 10 සිට 15 අතරේ වෙනස් වෙයි.

**(ඉ) මහ බැංකු කටයුතු**

විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළදී, මහ බැංකුවේ වත්කම්/වගකීම් හි රුපියල් දශ ලක්ෂ 148·3 ක හෙවත් සියයට 4·7 ක වැඩිවීමක් සටහන් විය. වත්කම්හි වැඩිවීම සමන්විත වූයේ දේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 119·5 කින් හා ජාත්‍යන්තර සංචිතය රුපියල් දශ ලක්ෂ 28·8 කින් ඉහළ යාමකිනි. දේශීය වත්කම් වැඩිවීම පහත දැක්වෙන ශීර්ෂයන්ගෙන් සංයුක්ත විය. රජයේ සහ රජය ඇප වූ සුරැකුම්පත්හි රුපියල් දශ ලක්ෂ 126·2 ක වැඩිවීමකින් ද, රජයට දුන් තාවකාලික අත්තිකාරම්හි රුපියල් දශ ලක්ෂ 25·8 ක වැඩිවීමකින් හා රජයට දුන් විශේෂ ණය ප්‍රමාණයෙහි රුපියල් දශ ලක්ෂ 3·7 ක වැඩිවීමකින් ද 'අනෙකුත් වත්කම් හා ගිණුම්' හි රුපියල් දශ ලක්ෂ 34·9 ක අඩුවීමකින් හා වෙළඳ බැංකුවලට දුන් අත්තිකාරම්හි රුපියල් දශ ලක්ෂ 1·3*ක අඩුවීමකින් ද විය. මහ බැංකුවේ දේශීය වත්කම්හි වූ ප්‍රසාරණයට හේතුවූයේ රජයට අමතර වශයෙන් මූල්‍ය සම්පත් සැපයීමයි

වගකීම් අංශය ගෙන බලන විට, විදේශීය බැංකුවලින් ගත් ණය රුපියල් දශ ලක්ෂ 155·6 කින් ඉහළ ගිය බව පෙනේ. මෙම වැඩිවීම, ජාත්‍යන්තර සංවිධාන සතු තැන්පතු රුපියල් දශ ලක්ෂ 106·1 කින් අඩුවීම නිසා, පාර්ශ්වීය වශයෙන් සමහන් විය. මෙහි ප්‍රතිඵලය වූයේ, එහි විදේශීය වගකීම්හි රුපියල් දශ ලක්ෂ 49·5ක ශුද්ධ වැඩිවීමක් ඇති වීමයි. ප්‍රධාන වශයෙන්ම, වෙළඳ බැංකු සතු තැන්පතුවල රුපියල් දශ ලක්ෂ 87·4 කද, රජයේ තැන්පතුවල රුපියල් දශ ලක්ෂ 48·0 කද, 'අනෙකුත් වගකීම් හා ගිණුම්හි' රුපියල් දශ ලක්ෂ 82·0 කද, ඇති වූ වැඩිවීම් වලින් හා පාර්ශ්වීය වශයෙන් එම වැඩිවීම් සමහන් කරමින්, ව්‍යවහාර මුදල් නිකුතුවෙහි රුපියල් දශ ලක්ෂ 122·3 ක අඩුවීමකින්ද, දේශීය වගකීම් පරිමාවෙහි ඇති වූ රුපියල් දශ ලක්ෂ 98·8 ක වැඩිවීම සැකසුනේය. ව්‍යවහාර මුදල් නිකුතුවෙහි වූ අඩුවීම, ප්‍රධාන වශයෙන්ම විමුල්‍යනයෙහි ප්‍රතිඵලයකි.

ක්‍රමවත් මූල්‍ය ප්‍රසාරණයක් අරමුණු කොට ගත් පියවරක් වශයෙන්, මහ බැංකුව සිය ශුද්ධ දේශීය වත්කම්වලට උපරිම සීමාවක් පැනවීමේ පිළිවෙත තවදුරටත් අනුගමනය කළේය. මෙහිදී රජයට දෙනු ලබන විශේෂ ණය හා තාවකාලික අත්තිකාරම්, මහ බැංකුව සතු, රජයේ සහ රජය මගින් සහතික කරන ලද සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් දුරීම් සහ මහ බැංකුව මගින් වෙළඳ බැංකුවලට දෙනු ලබන අත්තිකාරම් (කෘෂිකාර්මික ණය ක්‍රමය හා සහතික මිළ ක්‍රමය යටතේ දෙනු ලබන අත්තිකාරම් හැර) යන කොටස්වල එකතුවෙන් රජය සතු තැන්පතු සහ මහ බැංකුව වෙතැති විදේශ රාජ්‍යයන් සතු ගිණුම්හි ශේෂයන්ද අඩුකරලීමෙන් මෙම අරමුණ සඳහා වූ ශුද්ධ දේශීය වත්කම් සකසා ගැනෙයි. මෙම නිර්වචනයට අදල වූ ශුද්ධ දේශීය වත්කම්, 1969 දෙසැම්බර් 31 වැනි දින රුපියල් දශ ලක්ෂ 2054·1 සිට 1970 දෙසැම්බර් 31 වැනි දින වන විට රුපියල් දශලක්ෂ 2,115·2 දක්වා ඉහළ ගියේය.

මුලින් දක්වා ඇති බැංකු අනුපාතිකයෙහි වැඩිවීම හැර, 1968 සහ 1969 වාර්ෂික වාර්තාවන්හි දක්වා ඇති මහ බැංකු ණය ප්‍රතිපත්තියෙහි වෙනසක් මෙම වර්ෂයේදී ඇති නොවිය. 1969 ජුනි මාසයේදී සංශෝධිත වෙළඳ බැංකු ණයසීමාවන් 1970 වර්ෂය තුළදී ද එලෙසම බලපැවැත්විණි. සංශෝධිත සීමාවන් යටතේ රාජ්‍ය සංස්ථාවන් සඳහා වූ පදනම් සංඛ්‍යාව රුපියල් දශලක්ෂ 217 ක් වූ අතර, පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනු කරුවන් සඳහා එය රුපියල් දශලක්ෂ 955 ක් විය. ඒවායින් ගණනය කළ උපරිම සීමාවන් අනු පිළිවෙලින් රුපියල් දශලක්ෂ 272 ක් සහ රුපියල් දශලක්ෂ 1,023 ක් විය. 1969 සහ 1970 දෙසැම්බර් අවසානයන්හිදී පැවැති නොපියවා ඇති ණය ප්‍රමාණයන් II (ඈ) 18 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

---

* 1970 වර්ෂය තුළදී, මැදි හා දිගුකාලීන ණය අරමුදලෙන් වෙළඳ බැංකුවලට දෙන ලද අත්තිකාරම්හි ඇතිවූ රුපියල් දශලක්ෂ 5·6 ක වැඩිවීමක් මෙයට ඇතුළත් නොවේ. මැදි හා දිගුකාලීන ණය අරමුදලේ ශේෂයන්, මහ බැංකු ශේෂ පත්‍රයෙහි අඩංගු වනුයේ, 'අනෙකුත් වගකීම් හා ගිණුම්, යන ශීර්ෂය යටතේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම අරමුදලෙන් දෙනු ලබන අත්තිකාරම්, ශේෂ පත්‍රයේ 'අනෙකුත් අයට (වෙළඳ බැංකු) දෙන ලද අත්තිකාරම්' යන ශීර්ෂයෙහි පිළිබිඹු නොවේ.

## II (ඈ) 18 සංඛ්‍යා සටහන

### පෞද්ගලික අංශයට දෙන ලද වෙළඳ බැංකු ණය
### (මාසාවසානයෙහි පැවති සංඛ්‍යාවන්)

රුපියල් දශ ලක්ෂ

| | 1969 දෙසැම්බර් | 1970 දෙසැම්බර් |
|---|---|---|
| (අ) සීමාකරයට අදාල ණය | | |
| i රජයේ සමායතන .. .. | 214·7 | 220·0 |
| ii පෞද්ගලික අංශයේ අනෙකුත් ගනුදෙනුකරුවන් .. | | |
| 1. අපනයන, සංචාරක කටයුතු නැංවීම සහ තේ නිෂ්පාදනයට දෙනලද අත්තිකාරම් .. | 235·1 | 235·7 |
| 2. අනිකුත් අත්තිකාරම් .. | 712·2 | 652·3 |
| 3. ආනයන බිල්පත් .. .. | 55·0 | 27·8 |
| 4. දේශීය බිල්පත් .. .. | 17·6 | 13·8 |
| සීමාකරය යටතේ පෞද්ගලික අංශයේ අනෙකුත් ගනුදෙනු කරුවන්ට දුන් සම්පූර්ණ ණය ප්‍රමාණය .. | 1,019·9 | 929·6 |
| සීමාකරය යටතේ, රාජ්‍ය සමායතනයන්ට සහ පෞද්ගලික අංශයේ අනිකුත් ගනුදෙනු කරුවන්ට දුන් මුළු ණය ප්‍රමාණය .. .. | 1,234·6 | 1,149·6 |
| (ආ) සීමාකරයෙන් පරි බාහිර වූ ණය | | |
| 1. අපනයන බිල්පත් .. .. | 85·9 | 106·5 |
| 2. කෘෂිකර්මික ණය ක්‍රමය යටතේ දුන් ණය .. | 73·8 | 79·2 |
| 3. බඩු තොග කුවිතාන්සි ණය .. .. | 8·8 | 153·1 |
| 4. සමුපකාර ආයතනවලට දුන් අලෙවි ණය .. | 1·0 | 2·3 |
| 5. තේ කර්මාන්තශාලා නවීකරන ණය .. .. | 16·3 | 26·2 |
| 6. කර්මාන්ත සහ කෘෂිකර්මය සඳහා දුන් මැදි හා දිගු කාලීන ණය .. .. | | |
| රජයේ සමායතන .. .. | 39·0 | 77·0 |
| අනෙකුත් .. .. | 90·5 | 123·8 |
| සීමාකරයෙන් පරිබාහිර වූ මු[illegible] ණය ප්‍රමාණය .. | 315·3 | 568·1 |
| පෞද්ගලික අංශයට දුන් මුළු ණය ප්‍රමාණය .. | 1,549·9 | 1,717·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1969 දෙසැම්බර් සහ 1970 දෙසැම්බර් අතර කාලයේදී උපරිම සීමාවන් යටතේ වූ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 85·0 කින් අඩුවූ අතර, සීමාකරයට පරි බාහිරවූ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 252·8 කින් ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලය වූයේ පෞද්ගලික අංශයට දුන් මුළු ණය ප්‍රමාණයෙහි රුපියල් දශලක්ෂ 167·8 ක ඉහළ යාමකි. සහතික මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීම සඳහා දෙන ලද බඩු තොග කුවිතාන්සි ණය ප්‍රමාණයෙහි වැඩිවීම රුපියල් දශලක්ෂ 144·3 ක් වූයේ, සීමාකරයෙන් බාහිරව දෙන ලද ණය ප්‍රමාණයෙහි වැඩිවීමෙන් විශාල කොටසක් ඒවායින් සමන්විත විය. කර්මාන්ත සහ කෘෂිකර්මාන්තය සඳහා දෙන ලද මැදි හා දිගු කාලීන ණය ප්‍රමාණයෙහි වැඩිවීම රුපියල් දශලක්ෂ 71·3 කි. ණය සීමාවන්ට අදල නොවූ අනෙකුත් සෑම වර්ගයකම ණය ප්‍රමාණයන්හි ද සුළු වැඩිවීම් දක්නට තිබුණි

වෙළඳ බැංකුවලට සහ ණය දෙන අනිකුත් ආයතනවලට, මැදි හා දිගුකාලින ණය අරමුදලෙන් දෙන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය 1970 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 22·3 ක් විය. 1969 වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 34·7 ක් විය. තේ කර්මාන්ත ශාලා නවීකරණ සැලසුම් ක්‍රමය යටතේ, වෙළඳ බැංකුවලට ප්‍රතිමූල්‍ය ණය වශයෙන් දෙන ලද රුපියල් දශලක්ෂ 10·5 ක ප්‍රමාණයක් ද එයට ඇතුළත් වේ. මෙහිදී ආසියාතික සංවර්ධන බැංකුව මගින් විදේශ විනිමය කොටස ගෙවන ලදී. කාර්මික අරමුණු සඳහා දෙන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 11·5 ක් විය. එයින්, රුපියල් දශලක්ෂ 10·0 ක විශාල ප්‍රමාණයක් ලබාගන්නා ලද්දේ සංවර්ධන මූල්‍ය සමායතනයෙනි. 1970 වර්ෂයේදී වෙළඳ බැංකු මගින් ප්‍රයෝජනයට ගන්නා ලද කාර්මික ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1·5 ක් පමණි. 1969 වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 13·5 ක් විය.

1970 වර්ෂයේදී මූලික සංචිතයෙන්, මැදි හා දිගු කාලීන ණය අරමුදල සඳහා ණය මුදල් දී නොමැත. ආරම්භයේ සිට මෙම අරමුදලින් දෙන ලද ප්‍රතිමූල්‍ය ණයවලින් 1970 දෙසැම්බර් අවසානයේදී පැවති නොපිය වූ ශේෂය රුපියල් දශලක්ෂ 54·8 ක් විය. 1970 දෙසැම්බර් අවසානය වන විට අරමුදලෙහි ශේෂය රුපියල් දශලක්ෂ 5·3 කි.

(ඊ) බැංකු සංවර්ධනය

1970/71 අයවැය කථාව අනුව, 1969 වාර්ෂික වාර්තාවෙහි සඳහන් යෝජනාවන්ගෙන් බොහොමයක් ක්‍රියාවෙහි යෙදවීමට රජය අදහස් කරයි.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව ළඟදීම පිහිටුවනු ඇත. රජයේ උකස් බැංකුව සහ. කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනය, කෘෂිකාර්මික සංවර්ධන බැංකුව යන නමින් ඒකාබද්ධ කෙරෙනු ඇත. ඒ කෘෂිකාර්මික අරමුණු සඳහා පමණක් ණයදීමටය. ජාතික සංවර්ධන බැංකුවද පිහිටුවනු ඇත. එහි ප්‍රධාන කාර්යය වනුයේ, රාජ්‍ය අංශයේ කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ සංවර්ධනයන් සඳහා මැදි හා දිගු කාලීන ණය සැපයීමයි. එය සම්පූර්ණයෙන්ම මහ බැංකුවට අයිති උප ආයතනයකි.

ආර්ථික ක්‍රියාවන්ට මූල්‍යාධාර සැපයීමෙහිලා වඩා පුළුල්වූත්, වඩා කාර්යක්ෂමවූත් ක්‍රියාවලියක් අනුගමනය කළ හැකි වන පරිදි, ලංකා බැංකුව සහ මහජන බැංකුව සම්බන්ධිත ආඥා පනත් සංශෝධනය කෙරෙනු ඇත. තැන්පතු රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම පිණිස, මුදල් නීති පනතද සංශෝධනය කිරීමට සිදුවේ. වෙළඳ බැංකුවල නව ශාඛාවන් ආරම්භ කිරීමේදී, ඒවායේ පිහිටීම සහ ඒවා පිහිටුවීම සම්බන්ධිත ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීම පිණිස මෙම ආඥා පනත තවදුරටත් සංශෝධනය කෙරෙනු ඇත. ඒ අනුව මින්පසු බැංකු ශාඛාවන් විවෘත කිරීමට හැකිවනුයේ මුදල් මණ්ඩලයේ අනුමතිය ඇතිවය.

මූලික වශයෙන්, සම්ප්‍රදායික නොවන භාණ්ඩ අපනයනය කිරීමට සහ වෙළඳ බැංකුවලින් ණය ලබා ගත නොහැකි පුද්ගලයින්ට ආධාර සැපයීමේ පරමාර්ථයෙන් අපනයන-ආනයන බැංකුවක් පිහිටුවීමේ අදහසද ගරු මුදල් ඇමති තුමා විසින් ප්‍රකාශයට පත් කෙරිණි. මෙයට අදාළ කාර්යයන් වඩාත් යොමු කෙරෙනුයේ කෘෂිකාර්මික, කාර්මික හෝ වාණිජ සංවර්ධන වැඩ පිළිවෙලවල් වෙත නොව, ප්‍රධාන පෙළේ ආයතන මගින් භාර නොගන්නා නිර්යාත ණය සහතික කිරීම් වැනි කටයුතුවලට මැදිහත් වීමෙන් භාණ්ඩ එහා මෙහා ගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් සලසාලීම කෙරෙහිය. නව නිර්යාත මාර්ගයන් සොයා බැලීමටත් එහි ගනුදෙනුකරුවන් වෙනුවෙන් ලංකාව තුළ සහ විදේශයන්හි අලෙවි කටයුතු සම්බන්ධ පර්යේෂණ කටයුතු කිරීමටත් බැංකුව බලාපොරොත්තු වේ.

ලංකාවේ කුලීපිට ගැනුම් සහ මූල්‍ය ආයතනයන්හි කටයුතු විධිමත් කිරීමත් පාලනය කිරීමත් සඳහා යෝජනාවන් 1970 වර්ෂයේදී මහ බැංකුව විසින් සකස් කරන ලදී. රටේ පොදු මූල්‍ය ප්‍රතිපත්තියෙහි කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා ගත් පියවරකි, ඒ. තරඟකාරී මූල්‍ය ආයතනයන් හැම එකක්ම සඳහා පාලන සමතාවක් ඇති කිරීමටත්, ඒවායේ ද්‍රවශීලතා තත්ත්වය තහවුරු කිරීමටත්, එවැනි ආයතනයන්හි තැන්පතුකරුවන් ආරක්ෂා කිරීමටත් මෙම පාලනය මගින් බලාපොරොත්තු වෙයි. එකී යෝජනාවන් රජය මගින් පිළි ගෙන ඇති අතර, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථා කෙටුම් පතක් ළඟදීම සකස් කෙරෙනු ඇත.

භාර කුවිතාන්සි මගින් දේශීය වෙළඳාම සඳහා මූල්‍යාධාර සැපයීමට හැකි වන පරිදි 1947 (86 වැනි ඡේදය) අංක 12 දරණ භාර කුවිතාන්සි ආඥා පනත සංශෝධනය කිරීම පිණිස යෝජනාවන් සකස් කරනු ලදුව, ඒ සම්බන්ධ ව්‍යවස්ථා කෙටුම් පතක් රජය වෙත ඉදිරිපත් කරන ලදී.